# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2293/62 - 2022 අගෝස්තු මස 19 වැනි සිකුරාදා - 2022.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන පනත**

4 (2) වගන්තිය යටතේ ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මෙතැන් සිට ආයතනය ලෙස හඳුන්වන) වෙත පැවරී ඇති බලතල අනුව, ආයතනය විසින් 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ අරමුණු සඳහා මෙහි ප්‍රකාශයට පත්කර ඇති එකඟවූ ක්‍රියාපටිපාටි මත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 4400 (SLFRS 4400) ප්‍රකාශයට පත් කර ඇත. මෙම ප්‍රමිතිය 2022 ජනවාරි 1 හෝ ඉන්පසුව එසේ එකඟ වූ කාර්යභාර කොන්දේසි මත එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යභාරයන් සඳහා බලාත්මක වේ.

පාලක සභාවේ නියෝගය පරිදි,

ආර්. එස්. අනෝමා ප්‍රියදර්ශනි,
ලේකම්.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය,
අංක 30ඒ,
මලලසේකර මාවත,
කොළඹ 07.
2022 අගෝස්තු 19.

ශ්‍රී ලංකා ප්‍රමිතිය

**සම්බන්ධිත සේවා මත 4400 (සංශෝධිත)**

## එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන්

(2022 ජනවාරි 01 දින හෝ ඊට පසුව ගිවිසුම්ගත වීමේ නියමයන් සඳහා එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් සඳහා බලාත්මක වීම)

**පටුන**

| | ඡේදය |
|---|---|
| **හැඳින්වීම** | |
| මෙම සම්බන්ධිත සේවා මත ශ්‍රී.ලං.ප්‍ර.යෙහි විෂයපථය | 1–3 |
| එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් | 4–6 |
| මෙම සම්බන්ධිත සේවා මත ශ්‍රී.ලං.ප්‍ර.යෙහි අධිකාරිය | 7–10 |
| **බලාත්මක දිනය** | 11 |
| **අරමුණු** | **12** |
| **නිර්වචන** | **13** |
| **අවශ්‍යතා** | |
| මෙම සම්බන්ධිත සේවා මත ශ්‍රී.ලං.ප්‍ර. අනුව එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් පැවැත්වීම | 14–16 |
| අදාල සදාචාරාත්මක අවශ්‍යතා | 17 |
| වෘත්තීය විනිශ්චය | 18 |
| කාර්යයභාර මට්ටමේ තත්ත්ව පාලනය | 19–20 |
| කාර්යයභාරය පිළිගැනීම සහ අඛන්ඩව පවත්වාගෙන යෑම | 21–23 |
| කාර්යයභාරයේ කොන්දේසිවලට එකඟ වීම | 24–26 |
| එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කිරීම | 27–28 |
| වෘත්තියෙකුගේ විශේෂඥතා කාර්යය භාවිතා කිරීම | 29 |
| එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව | 30–33 |
| එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරය, තවත් කාර්යයභාරයක් සමඟ එක්ව භාරගැනීම | 34 |
| ලේඛනගත කිරීම | 35 |

**ව්‍යවහාරය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ දේවල්**


| | |
|---|---|
| මෙම සම්බන්ධිත සේවා මත ශ්‍රී.ලං.ප්‍ර.යෙහි විෂයපථය | අ1-අ8 |
| බලාත්මක දිනය | අ9 |
| නිර්වචන | අ10-අ13 |
| අදාල සදාචාරාත්මක අවශ්‍යතා | අ14 - අ20 |
| වෘත්තීය විනිශ්චය | අ21 - අ23 |
| කාර්යයභාර මට්ටමේ තත්ත්ව පාලනය | අ24 - අ27 |
| කාර්යයභාරය පිළිගැනීම සහ අඛන්ඩව පවත්වාගෙන යෑම | අ28 - අ38 |
| කාර්යයභාරයේ නියමයන්ට එකඟවීම | අ39 - අ44 |
| එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කිරීම | අ45 |
| වෘත්තීයයෙකුගේ විශේෂඥ කාර්යය භාවිතා කිරීම | අ46 - අ50 |
| එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව | අ51-අ58 |
| එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් තවත් කාර්යයභාරයක් සමඟ එක්ව භාර ගැනීම | අ59 |
| ලේඛනගත කිරීම | අ60 |

පරිශිෂ්ඨ 1 : එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් සඳහා නිදර්ශනාත්මක කාර්යයභාරයේ ලිපිය

පරිශිෂ්ඨ 2 : එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවල නිදර්ශන


සම්බන්ධිත සේවා මත ශ්‍රී ලංකා ප්‍රමිතිය (ස.සේ. මත ශ්‍රී.ලං.ප්‍ර. 4400 (සංශෝධිත), එකඟ වූ ක්‍රියාපටිපාටි *කාර්යභාරයන්, ශ්‍රී ලංකා තත්ත්ව පාලනය, විගණනය, සමාලෝචනය, වෙනත් සහතික කිරීම් සහ සම්බන්ධිත සේවා ප්‍රකාශවල* පෙරවදනෙහි සන්දර්භය තුල කියවිය යුතුය.

**හැඳින්වීම**

**මෙම සම්බන්ධිත සේවා මත ශ්‍රී.ලං.ප්‍ර.හි විෂයපථය**

1. අදාල සේවා පිළිබඳ මෙම ශ්‍රී ලංකා ප්‍රමිතිය කටයුතු කරන්නේ:
   (අ) එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් ඉටු කිරීමට කාර්යයභාරයේ නිරත වන විට වෘත්තිකයාගේ වගකීම්; සහ
   (ආ) එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ ආකෘතිය සහ අන්තර්ගතය.

2. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි මූල්‍ය හෝ මූල්‍ය නොවන විෂය කරුණු මත එකඟ වූ ක්‍රියාපටිපාටිවල කාර්ය සාධනය සඳහා ව්‍යවහාර කරයි. (යොමුව : අ1 - අ2 ඡේද)

තත්ත්ව පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය *(SLSQC 1[1])* සමඟ සම්බන්ධතාවය

3. තත්ත්ව පාලන පද්ධති, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ආයතනයේ වගකීම වේ. SLSQC1, ආයතනයක එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් සම්බන්ධයෙන් වෘත්තීය ගණකාධිකාරිවරුන්ගේ විගණන ආයතනවලට ව්‍යවහාර කරයි. තනි එකඟවූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් මට්ටමෙන් තත්ත්ව පාලනය පිළිබඳ මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි ප්‍රතිපාදන, SLSQC 1 හෝ අවම වශයෙන් ඉල්ලා සිටින අවශ්‍යතාවලට ආයතනය යටත්වන පදනම මත පදනම් වේ. (යොමුව : අ3 - අ8 ඡේද)

**එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන්**

4. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයකදී, කාර්යයභාරයේ අරමුණ සඳහා සිදු කරන ලද ක්‍රියාපටිපාටි සුදුසු බව කාර්යයභාරය සිදු කරන පාර්ශවය පිළිගෙන ඇති විට වෘත්තිකයා හා සම්බන්ධ වන පාර්ශවය විසින් එකඟ වී ඇති ක්‍රියාපටිපාටි වෘත්තිකයා ඉටු කරයි. සිදු කරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටි සහ අදාල සොයා ගැනීම් වෘත්තිකයා එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ සන්නිවේදනය කරයි. වෘත්තිකයා විසින් වාර්තාකරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටි සහ සොයා ගැනීම් සහ වෘත්තිකයා විසින් සිදු කරනු ලැබූ කාර්යයන් තමන්ගේම නිගමන ලෙස සම්බන්ධිත පාර්ශවය සහ අනෙකුත් අපේක්ෂිත පරිශීලකයින් සළකා බලනු ලැබේ.

5. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි ප්‍රතිඵල අනුව ඉටු කරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක වටිනාකම :
   (අ) අදාල සදාචාරාත්මක අවශ්‍යතා ඇතුළුව වෘත්තිකයාගේ වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූල වීම; සහ
   (ආ) ඉටු කරන ලද ක්‍රියාපටිපාටි සහ අදාල සොයාගැනීම් පිළිබඳ පැහැදිලි සන්නිවේදනය.

6. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් යනු විගණනයක්, සමාලෝචනයක් හෝ වෙනත් සහතික කිරීමක් නොවේ. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයකට වෘත්තිකයා කිසියම් ආකාරයක මතයක් හෝ සහතික නිගමනයක් ප්‍රකාශ කිරීමේ අරමුණ සඳහා සාක්ෂි ලබා ගැනීම ඇතුලත් නොවේ.

**මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි අධිකාරිය**

7. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි අවශ්‍යතා සකසා ඇති සන්දර්භය සපයන ශ්‍රී ලංකා ප්‍රමිතිය අනුගමනය කිරීමේදී වෘත්තිකයාගේ අරමුණු මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි අඩංගු වේ. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයකදී ඉටුකල යුතු දේ අවබෝධ කර ගැනීම සඳහා වෘත්තිකයාට සහාය වීම අරමුණු තුලින් අපේක්ෂා කරයි.

8. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි ප්‍රකාශිත අරමුණු සපුරාලීමට වෘත්තිකයාට හැකි වන පරිදි නිර්මාණය කර ඇති "යුතු" භාවිතයෙන් ප්‍රකාශිත අවශ්‍යතා අඩංගු වේ.

9. මීට අමතරව, මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි, මෙම ශ්‍රී ලංකා ප්‍රමිතිය පිළිබඳ නිසි අවබෝධයකට අදාල සන්දර්භය සපයන හඳුන්වාදීමේ දේවල්, නිර්වචන සහ ව්‍යවහාරය හා වෙනත් පැහැදිලි කිරීමේ දේ අඩංගු වේ.

10. ව්‍යවහාරය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ දේවල් ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා වන අවශ්‍යතා සහ මාර්ගෝපදේශ පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම් සපයයි. එවැනි මඟපෙන්වීමක් විසින්ම අවශ්‍යතාවයක් පනවන්නේ නැති අතර,

---

[1] තත්ත්ව පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය (SLSQC) 1, මූල්‍ය ප්‍රකාශවල විගණන සහ සමාලෝචන සිදුකරන ආයතන සඳහා තත්ත්ව පාලනය සහ වෙනත් සහතික කිරීම් සහ අදාල සේවා කටයුතු.

අවශ්‍යතා නිසි ව්‍යවහාර කිරීමට එය අදාල වේ. ව්‍යවහාරය හා අනෙකුත් පැහැදිලි කිරීමේ දේවල් මඟින් අවශ්‍යතා යෙදීමට සහාය වන මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි ආමන්ත්‍රණය කර ඇති කරුණු පිළිබඳ පසුබිම් තොරතුරු ද සැපයිය හැකිය.

## බලාත්මක දිනය

11. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතිය 2022 ජනවාරි 01 හෝ ඊට පසුව එකඟ වූ ගිවිසුම්ගත ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් සඳහා බලාත්මක වේ. (යොමුව : අ9 ඡේදය)

## අරමුණු

12. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතිය යටතේ එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් වෘත්තිකයාගේ අරමුණු වනුයේ :

(අ) ඉටු කලයුතු ක්‍රියාපටිපාටි පිළිබඳව සම්බන්ධිත පාර්ශවය සමඟ එකඟ වීම.

(ආ) එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කිරීම; හා

(ඇ) මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව සිදුකරන ලද ක්‍රියාපටිපාටි සහ අදාල සොයා ගැනීම් සන්නිවේදනය කිරීම.

## නිර්වචන

13. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි අරමුණු සඳහා, පහත සඳහන් යෙදුම්වලට පහත අර්ථ දක්වා ඇතඃ

(අ) එකඟ වූ ක්‍රියාපටිපාටි - වෘත්තිකයා සහ සම්බන්ධිත පාර්ශවය (සහ අදාල නම්, වෙනත් පාර්ශව) විසින් එකඟ වී ඇති ක්‍රියාපටිපාටි (යොමුව : අ10 ඡේදය)

(ආ) එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරය - වෘත්තිකයා සහ සම්බන්ධිත පාර්ශවය (සහ අදාල නම්, වෙනත් පාර්ශව) එකඟ වී ඇති ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමට සහ එකඟ වූ ක්‍රියාපටිපාටි සහ අදාල සොයාගැනීම් සන්නිවේදනය කිරීමට ක්‍රියාපටිපාටි වාර්තාව මත වෘත්තිකයෙකු යෙදී සිටින කාර්යයභාරයකි. (යොමුව : අ10 ඡේදය)

(ඇ) කාර්යයභාරයේ හවුල්කරු - කාර්යයභාරය සහ එහි කාර්යසාධනය සඳහා වගකිව යුතු ආයතනය වෙනුවෙන් නිකුත් කරනු ලබන ක්‍රියාපටිපාටි වාර්තා කිරීම සඳහා වගකිව යුතු හවුල්කරු හෝ ආයතනයේ වෙනත් පුද්ගලයෙකු සහ අවශ්‍ය වූ විට වෘත්තීමය, නෛතික හෝ නියාමන ආයතනයක යෝග්‍ය අධිකාරියක් ඇති අයෙකි.

(ඈ) කාර්යයභාරයේ නිරත පාර්ශවය - එකඟ වූ ක්‍රියාපටිපාටි වල කාර්යයභාරය ඉටු කිරීමට වෘත්තිකයා සම්බන්ධ කර ගන්නා පාර්ශව(යන්). (යොමුව : අ11 ඡේදය)

(ඉ) කාර්යයභාරයේ නිරත කණ්ඩායම - එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරය ඉටු කරන සියළුම හවුල් කරුවන් සහ කාර්ය මණ්ඩලය, සහ කාර්යයභාරය මත ක්‍රියාපටිපාටි ඉටුකරන සමාගමක් හෝ ජාල සමාගමක් විසින් නියුක්ත කරනු ලබන ඕනෑම පුද්ගලයකු වේ. මෙය සමාගම හෝ ජාල සමාගමක් විසින් නියුක්ත කර සිටින වෘත්තිකයෙකුගේ බාහිර විශේෂඥයකු බැහැර කරයි.

(ඊ) සොයාගැනීම් - සොයාගැනීම් යනු ඉටු කරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටිවල සත්‍ය ප්‍රතිඵල වේ. සොයාගැනීම් අරමුණුගතව සත්‍යාපනය කිරීමට හැකියාව ඇත. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි යොමු කිරීම් සොයා ගැනීම් වෙත ඕනෑම ආකාරයක අදහස් හෝ නිගමන මෙන්ම වෘත්තිකයා විසින් කළහැකි ඕනෑම නිර්දේශයක් බැහැර කරයි. (යොමුව : අ12 - අ13 ඡේද)

(උ) අපේක්ෂිත පරිශීලකයින් - එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව භාවිතා කරනු ඇතැයි වෘත්තිකයා අපේක්ෂා කරන තනි පුද්ගලයන් (යා) හෝ සංවිධාන(ය) හෝ කණ්ඩායම(ම්) වේ. සමහර අවස්ථාවලදී, එකඟවූ ක්‍රියාපටිපාටි වාර්තාව ආමන්ත්‍රණය කරනු ලබන අය හැර වෙනත් අපේක්ෂිත පරිශිලකයින් සිටිය හැකිය. (යොමුව : අ10 ඡේදය)

(ඌ) වෘත්තිකයා - කාර්යයභාරයේ නිරත තනි පුද්ගලයා(යන්) (සාමාන්‍යයෙන් කාර්යයභාර හවුලකරු හෝ කාර්යයභාර කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන් හෝ අදාල වන පරිදි, සමාගම) මෙම ශ්‍රී ලංකා ප්‍රමිතිය විසින් අවශ්‍යතාවයක් හෝ වගකීමක් ඉටු කිරීමට ප්‍රකාශිතව අදහස් කරන විට "වෘත්තිකයා" වෙනුවට "කාර්යයභාරයේ හවුලකරු" යන යෙදුම භාවිතා වේ.

(එ) වෘත්තිකයාගේ විශේෂඥයා - එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරය සඳහා වෘත්තිකයාගේ වගකීම් ඉටු කිරීමේ දී වෘත්තිකයාට සහායවීම සඳහා එම ක්ෂේත්‍රයේ කාර්යය භාවිතා කරන, සහතික කිරීම සහ අදාල සේවාවන් හැර වෙනත් ක්ෂේත්‍රයක ප්‍රවීනත්ත්වයක් ඇති පුද්ගලයෙකු හෝ සංවිධානයක් වේ. වෘත්තිකයෙකුගේ විශේෂඥයෙකු වෘත්තිකයෙකුගේ අභ්‍යන්තර විශේෂඥයෙකු (ඔහු වෘත්තිකයාගේ සමාගමේ හෝ ජාල සමාගමක, තාවකාලික කාර්ය මණ්ඩලය ඇතුළුව, හවුල් කරුවෙකු හෝ කාර්යමණ්ඩල සාමාජිකයකි) හෝ වෘත්තිකයෙකුගේ බාහිර විශේෂඥයෙකු විය හැකිය.

(ඒ) වෘත්තීය විනිශ්චය - මෙම ශ්‍රී ලංකා ප්‍රමිතිය මගින් සපයනු ලබන සන්දර්භය තුල අදාල පුහුණුව, දැනුම සහ පළපුරුද්ද ව්‍යවහාරය සහ එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාර තත්ත්වයන් තුල යෝග්‍ය ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් තීරණ ගැනීමේදී අදාල සදාචාරාත්මක අවශ්‍යතා වේ.

(ඔ) අදාල ආචාර ධර්ම අවශ්‍යතා - එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් ඉටු කිරීමේදී කාර්යයභාර කණ්ඩායම යටත් වන ආචාර ධර්ම අවශ්‍යතා වේ. මෙම අවශ්‍යතා සාමාන්‍යයෙන් සමන්විත වන්නේ *ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද වෘත්තීය ගණකාධිකාරිවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහය (CA ශ්‍රී ලංකා සංග්‍රහය)* සහ ඊට වඩා වැඩි සීමාකාරි ජාතික අවශ්‍යතා සමඟිනි.

(ඕ) වගකිව යුතු පාරශවය - එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කරනු ලබන විෂය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවය(යන්) වේ.

**අවශ්‍යතා**

**මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූලව එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් සිදු කිරිම**

14. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි ව්‍යවහාරය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ දේවල් ඇතුළුව එහි අරමුණු අවබෝධ කර ගැනීමට සහ එහි අවශ්‍යතා නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට වෘත්තිකයාට අවබෝධයක් තිබිය යුතුය.

*අදාල අවශ්‍යතා සමඟ අනුකූලවීම*

15. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයට විශේෂිත අවශ්‍යතාවයක් අදාල නොවන්නේ නම් මිස වෘත්තිකයා මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි එක් එක් අවශ්‍යතාවයට අනුකූල විය යුතුය, උදාහරණයක් ලෙස, අවශ්‍යතාවයෙන් ආමන්ත්‍රණය කරන ලද තත්ත්වයන් කාර්යයභාරයක නිරතවීමකදී නොමැති නම්.

16. වෘත්තිකයා එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයට අදාල මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි සියළුම අවශ්‍යතා සපුරාලන්නේ නම් මිස, වෘත්තිකයා මෙම ශ්‍රී ලංකා ප්‍රමිතිය සමඟ අනුකූලවීම නියෝජනය නොකළ යුතුය.

**අදාල ආචාරධර්ම අවශ්‍යතා**

17. වෘත්තිකයා අදාල ආචාර ධර්ම අවශ්‍යතාවලට අනුකූල විය යුතුය (යොමුව : අ14 - අ20 ඡේද).

**වෘත්තීය විනිශ්චය**

18. කාර්යයභාරයේ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් මත පිළිගැනීම, සිදුකිරීම සහ වාර්තා කිරීමේදී වෘත්තිකයා, වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කළ යුතුය. (යොමුව අ21 - අ23 ඡේද)

**කාර්යයභාර මට්ටමේ තත්ත්ව පාලනය**

19. කාර්යයභාර හවුල්කරු පහත දෑ සඳහා භාරගත යුතුයි.

(අ) අදාල නම්, වෘත්තිකයෙකුගේ විශේෂඥයකු විසින් සිදු කරනු ලබන කාර්යයන් ඇතුළුව එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ සමස්ත ගුණාත්මකභාවය (යොමුව අ24 ඡේදය); සහ

(ආ) ආයතනයේ තත්ත්ව පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලට අනුකූලව සිදු කරනු ලබන කාර්යයභාරයඃ

(i) සේවාදායක සබඳතා සහ කාර්යයභාරයන් පිළිගැනීම සහ අඛන්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් යෝග්‍ය ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම මගින් (යොමුව: අ25 ඡේදය);

(ii) කාර්යයභාර කණ්ඩායමට සහ කාර්යභාර කණ්ඩායමේ කොටසක් නොවන ඕනෑම වෘත්තිකයෙකුගේ විශේෂඥයින්ට එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයකට සාමුහිකව සුදුසු නිපුනතා සහ හැකියාවන් ඇති බවට සෑහීමකට පත්වීම මගින්;

(iii) කාර්යයභාර කණ්ඩායමේ සාමාජිකයින් අදාල ආචාරධර්ම අවශ්‍යතාවලට අනුකූල නොවන බවට ඇඟවීම් පිළිබඳව අවධානයෙන් සිටීම සහ කාර්යයභාර කණ්ඩායමේ සාමාජිකයින් අදාල ආචාර ධර්ම අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර නොමැති බව පෙන්නුම් කරන කරුණු කාර්යයභාර හවුල්කරුගේ අවධානයට ලක් වුවහොත් සුදුසු ක්‍රියා මාර්ග තීරණය කිරීම මගින් (යොමුව : අ26 ඡේදය);

(iv) වෘත්තීය ප්‍රමිතීන්ට සහ අදාල නෛතික හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය සහ ඉටු කිරීම මගින්; සහ

(v) යෝග්‍ය නියැලීම් ලේඛන පවත්වා ගෙන යාම සඳහා වගකීම භාර ගැනීම මගින්.

20. වෘත්තිකයෙකුගේ විශේෂඥයකුගේ කාර්යය භාවිතා කිරීමට අවශ්‍ය නම්, එකඟතාවයට ඇතුලත් කර ඇති ක්‍රියාපටිපාටි වාර්තාව මත සොයා ගැනීම් සඳහා වගකීම භාර ගැනීමට ප්‍රමාණවත් ප්‍රමාණයකට වෘත්තිකයාගේ විශේෂඥයාගේ කාර්යයට සම්බන්ධ වීමට වෘත්තිකයාට හැකිවන බවට කාර්යභාර හවුල්කරු සෑහීමකට පත්විය යුතුය. (යොමුව: අ27 ඡේදය).

**කාර්යයභාරය පිළිගැනීම අඛණ්ඩව කරගෙන යෑම**

21. එකඟවූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් පිළිගැනීමට හෝ අඛණ්ඩව කරගෙන යෑමට පෙර, වෘත්තිකයා කාර්යයභාරයේ අරමුණ පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා වෘත්තිකයා විසින් සිදු කරන ලෙස ඉල්ලා සිටිනු ලබන ක්‍රියාපටිපාටි නුසුදුසු බව පෙන්නුම් කරන යම් කරුණු හෝ තත්ත්වයන් පිළිබඳව වෘත්තිකයා දන්නේ නම්, වෘත්තිකයා එම කාර්යයභාරය පිළි නොගැනීම හෝ අඛණ්ඩව කරගෙන යෑම නොකළයුතුය. (යොමුව : අ28 - අ31 ඡේද).

22. වෘත්තිකයා එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරය පිළිගැනීම හෝ අඛණ්ඩව කරගෙන යාම කළයුත්තේ පහත සඳහන් අවස්ථාවලදී පමණි. (යොමුව : අ28 - අ31 ඡෙද):

(අ) කාර්යයභාරයේ අරමුණ සඳහා වෘත්තිකයා විසින් ඉටු කිරීමට අපේක්ෂිත ක්‍රියාපටිපාටි සුදුසු බව සම්බන්ධිත පාර්ශවය පිළිගනී;

(ආ) එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හැකි වෙතැයි වෘත්තිකයා අපේක්ෂා කරයි;

(ඇ) එකඟ වූ ක්‍රියාපටිපාටි හා අදාල සොයාගැනීම් අරමුණුගතව, පැහැදිලි, නොමඟ යවන සුළු නොවන සහ විවිධ අර්ථකථන වලට යටත් නොවන ලෙස විස්තර කළ හැකිය; (යොමුව : අ32 - අ36 ඡේද)

(ඇ) අදාල ආචාර ධර්ම අවශ්‍යතාවලට අනුකූල නොවන බව විශ්වාස කිරීමට වෘත්තිකයාට හේතුවක් නැත; හා

(ඉ) වෘත්තිකයාට ස්වාධීන අවශ්‍යතාවලට අනුකූලවීමට අවශ්‍ය නම්, ස්වාධීන අවශ්‍යතාවලට අනුකූල නොවන බව විශ්වාස කිරීමට වෘත්තිකයාට හේතුවක් නොමැත. (යොමුව : ඡේද අ37 - අ38)

23. කාර්යයභාර හවුල්කරු ලබා ගන්නා තොරතුරු කලින් ලැබුණි නම්, ආයතනය නියැලීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වන්නේ නම්, සමාගමට සහ හවුල්කරුට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි. කාර්යයභාර හවුල්කරු එම තොරතුරු වහාම සමාගමට සන්නිවේදනය කළ යුතුය.

**කාර්යයභාරයේ නියමයන්ට එකඟවීම**

24. නිරත වන පාර්ශවය සමඟ එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ නියමයන් සමඟ වෘත්තිකයා එකඟ වීම සහ එකඟ වූ කාර්යයභාරයේ නියමයන්, කාර්යයභාරයක නිරතවීම් ලිපියක හෝ වෙනත් සුදුසු ලිඛිත ගිවිසුමක වාර්තා කළ යුතුය. මෙම නියමයන්ට පහත සඳහන් දෑ ඇතුලත් විය යුතුය: (යොමුව : අ39 - අ40 ඡේද)

(අ) එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කරනු ලබන විෂය කරුණු හඳුනාගැනීම;

(ආ) කාර්යයභාරයේ අරමුණ සහ සම්බන්ධිත පාර්ශවය විසින් හඳුනාගෙන ඇති එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ අපේක්ෂිත පරිශීලකයින්;

(ඇ) අදාල නම්, සම්බන්ධිත පාර්ශවය විසින් හඳුනාගෙන ඇති වගකිවයුතු පාර්ශවය සහ එකඟ වූ ක්‍රියාපටිපාටි සිදු කරනු ලබන විෂය සම්බන්ධයෙන්, වගකිව යුතු පාර්ශවය වගකිව යුතුය යන පදනම මත එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරය ඉමු කරන බවට ප්‍රකාශයක්;

(ඈ) එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාර ඉමු කිරීමේදී අදාල ආචාරධර්ම අවශ්‍යතා පිළිගැනීමට වෘත්තිකයා අනුකූල වනු ඇත;

(ඉ) වෘත්තිකයා ස්වාධීන අවශ්‍යතාවලට අනුකූල විය යුතුද යන්න පිළිබඳ ප්‍රකාශයක් සහ, එසේ නම්, අදාල ස්වාධීන අවශ්‍යතා ; (යොමුව: අ37 - අ38 ඡේද)

(ඊ) පහත ප්‍රකාශ ඇතුළුව, එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක ස්වභාවය:

- (i) එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක වෘත්තිකයා සම්බන්ධිත පාර්ශවය (සහ අදාල නම් වෙනත් පාර්ශවයන්) සමඟ එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කිරීම සහ සොයා ගැනීම් වාර්තා කිරීම ඇතුලත් වේ; (යොමුව: අ10 ඡේදය)
- (ii) සොයා ගැනීම් යනු ඉටු කරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටිවල සත්‍ය ප්‍රතිඵල වේ; සහ
- (iii) එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් යනු සහතික වීමක් නොවන අතර, ඒ අනුව, වෘත්තිකයා මතයක් හෝ සහතික නිගමනයක් ප්‍රකාශ නොකරයි;

(උ) කාර්යයභාරයේ පාර්ශවය (සහ අදාල නම් වෙනත් පාර්ශව) විසින් එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා සුදුසු බව පිළිගැනීම; (යොමුව: අ10 ඡේදය)

(ඌ) එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ ලිපිනය හඳුනා ගැනීම;

(එ) සිදු කළ යුතු ක්‍රියාපටිපාටිවල ස්වභාවය, කාලය සහ ප්‍රමාණය, පැහැදිලි, නොමඟ යවන සුළු නොවන සහ විවිධ අර්ථ කථනවලට යටත් නොවන වචනවලින් විස්තර කිරීම. (යොමුව : අ41 - අ42) ඡේද; සහ

(ඒ) එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ අපේක්ෂිත ආකෘතිය සහ අන්තර්ගතය වෙත යොමු කිරීම;

25. කාර්යයභාරය අතරතුර එකඟ වූ ක්‍රියාපටිපාටි සංශෝධන කරනු ලබන්නේ නම් සංශෝධනය, කරන ලද ක්‍රියාපටිපාටි පිළිබිඹු කරන කාර්යයභාරයේ පාර්ශවය සමඟ සංශෝධිත නියැලීම් නියමයන්වලට වෘත්තිකයා එකඟ විය යුතුය. (යොමුව: අ43 ඡේදය).

*පුනරාවර්තන එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන්*

26. පුනරාවර්තන ක්‍රියාපටිපාටි කාර්යයභාරයන්වලදී, කාර්යයභාරයන් සළකා බැලීමේ ප්‍රතිශ්ඨාවල වෙනස්කම් ඇතුළුව, කාර්යයභාර නියමයන් සංශෝධනය කිරීමට අවශ්‍යද යන්න සහ දැනට පවතින කොන්දේසි පිළිබඳව සම්බන්ධ වන පාර්ශවයට සිහි කිරීමේ අවශ්‍යතාවයක් තිබේද යන්න පිළිබඳව වෘත්තිකයා විසින් ඇගයීමට ලක් කළ යුතුය. (යොමුව : අ44 ඡේදය)

**එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටුකිරීම**

27. කාර්යයභාර නියමයන් තුල එකඟ වූ ක්‍රියාපටිපාටි වෘත්තිකයා විසින් ඉටුකළ යුතුය.

28. ලිඛිත නියෝජනයක් ඉල්ලා සිටිය යුතුද යන්න වෘත්තිකයා විසින් සළකා බැලිය යුතුය. (යොමුව : අ45 ඡේදය).

**වෘත්තිකයෙකුගේ විශේෂඥයෙකුගේ කාර්යය භාවිතා කිරීම**

29. වෘත්තිකයා, වෘත්තිකයෙකුගේ විශේෂඥයෙකුගේ කාර්යය භාවිතා කරන්නේ නම්, වෘත්තිකයා පහත දෑ සිදුකළ යුතුය (යොමුව : අ46 - අ47, අ50 ඡේද)

(අ) වෘත්තිකයාගේ විශේෂඥයාගේ නිපුනත්වය, හැකියාවන් සහ අරමුණුගතබව ඇගයීම;

(ආ) විශේෂඥයාගේ කාර්යයේ ස්වභාවය, විෂයපථය සහ අරමුණු පිළිබඳව වෘත්තිකයාගේ විශේෂඥයා සමග එකගවීම; (යොමුවඃ අ48 - අ49 ඡේද)

(ඇ) වෘත්තිකයාගේ විශේෂඥයා විසින් ඉටු කරන ලද කාර්යයේ ස්වභාවය, කාලය සහ ප්‍රමාණය, විශේෂඥයා සමග එකග වූ කාර්යයට අනුකූල ද යන්න තීරණය කිරීම; හා

(ඈ) වෘත්තිකයාගේ විශේෂඥයා විසින් ඉටු කරන ලද කාර්යය සැළකිල්ලට ගනිමින් ඉටු කරන ලද කාර්යයේ ප්‍රතිඵල ප්‍රමාණවත් ලෙස විස්තර කර ඇත්ද යන්න තීරණය කිරීම.

**එකග වූ ක්‍රියාපටිපාටි වාර්තාව**

30. එකග වූ ක්‍රියාපටිපාටි වාර්තාව ලිඛිතව තිබිය යුතු අතර, එයට ඇතුලත් වන්නේඃ (යොමුවඃ අ51 ඡේදය)

(අ) වාර්තාව එකග වූ ක්‍රියාපටිපාටි වාර්තාවක් බව පෙන්නුම් කරන මාතෘකාවක්;

(ආ) කාර්යයභාර නියමයන්හි දක්වා ඇති ආමන්ත්‍රණය කරන්නෙක්;

(ඇ) එකග වූ ක්‍රියපටිපාටි ඉටු කරනු ලබන විෂය කරුණු හඳුනා ගැනීම; (යොමුවඃ අ52 ඡේදය)

(ඈ) එකග වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ අරමුණ හඳුනා ගැනීම සහ එකග වූ ක්‍රියාපටිපාටි වාර්තාව වෙනත් අරමුණක් සඳහා සුදුසු නොවන බවට ප්‍රකාශයක්; (යොමුව : අ53 - අ54 ඡේද)

(ඉ) එකග වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක විස්තරයක පහත දෑ සඳහන් කිරීමඃ

(i) එකග වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක වෘත්තිකයා සම්බන්ධ වන පාර්ශවය (සහ අදාල නම්, වෙනත් පාර්ශවයන්) සමග එකග වූ ක්‍රියාපටිපාටි ඉටු කිරීම සහ සොයා ගැනීම් වාර්තා කිරීම ඇතුලත් වේ; (යොමුවඃ අ10 ඡේදය)

(ii) සොයා ගැනීම් යනු ඉටු කරන ලද එකග වූ ක්‍රියාපටිපාටිවල සත්‍ය ප්‍රතිඵල වේ; සහ

(iii) නිරත වන පාර්ශවය (සහ අදාල නම්, වෙනත් පාර්ශවයන්) එකග වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා සුදුසු බව පිළිගෙන තිබීම; (යොමුව : අ10 ඡේදය)

(ඊ) අදාල නම්, සම්බන්ධිත පාර්ශවය විසින් හඳුනාගෙන ඇති වගකිව යුතු පාර්ශවය සහ එකග වූ ක්‍රියාපටිපාටි සිදු කරනු ලබන විෂය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවය, වගකිව යුතු බවට ප්‍රකාශයක්;

(උ) සම්බන්ධිත සේවා මත ශ්‍රී.ලං.ප්‍ර.යෙහි 4400 (සංශෝධිත)ව අනුව කාර්යයභාරය ඉටු කර ඇති බවට ප්‍රකාශයක්;

(ඌ) එකග වූ ක්‍රියාපටිපාටිවල යෝග්‍යතාවය සම්බන්ධයෙන් වෘත්තිකයා කිසිදු නියෝජනයක් නොකරන බවට ප්‍රකාශයක්;

(එ) එකග වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරය, සහතික කිරීමේ කාර්යයභාරයක් නොවන බවට ප්‍රකාශයක් සහ ඒ අනුව, වෘත්තිකයට මතයක් හෝ සහතික නිගමනයක් ප්‍රකාශ නොකිරීම;

(ඒ) වෘත්තිකයා අතිරේක ක්‍රියාපටිපාටි ඉටු කලේ නම්, වාර්තා කළහැකි වෙනත් කරුණු වෘත්තිකයාගේ අවධානයට යොමුවිය හැකි බවට ප්‍රකාශයක්;

(ඔ) වෘත්තිකයා CA ශ්‍රී ලංකා ආචාර ධර්ම සංග්‍රයේ අවශ්‍යතා හෝ වෙනත් වෘත්තීය අවශ්‍යතා හෝ නීතියෙන් හෝ නියාමනය මගින් පනවනු ලබන අවශ්‍යතාවලට අවම වශයෙන් ඉල්ලුම් කරන ප්‍රකාශයක්;

(ඕ) ස්වාධීනත්වය සම්බන්ධයෙන්:

(i) වෘත්තිකයා ස්වාධිනව සිටීම අවශ්‍ය නොවේ නම් සහ ස්වාධීන අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා කාර්යයභාරයේ නියමයන්ට වෙනත් ආකාරයකින් එකඟ වී නොමැති නම්, කාර්යයභාරයේ අරමුණ සඳහා වෘත්තිකයාට අනුකූල වීමට අවශ්‍ය ස්වාධීන අවශ්‍යතා නොමැති බවට ප්‍රකාශයක් ; හෝ

(ii) වෘත්තිකයා ස්වාධීන වීමට අවශ්‍ය නම් හෝ ස්වාධීන අවශ්‍යතා වලට අනුකූල වීම සඳහා කාර්යයභාර නියමයන්ට එකඟ වී ඇත්නම්, වෘත්තිකයා අදාල ස්වාධීන අවශ්‍යතා වලට අනුකූල වී ඇති බවට ප්‍රකාශයක්, ප්‍රකාශය අදාල ස්වාධීන අවශ්‍යතා හඳුනාගත යුතුය;

(ක) වෘත්තිකයා සාමාජිකයකු වන සමාගම SLSQC 1හෝ අවම වශයෙන් SLSQC 1 තරමට ඉල්ලුමක් ඇති වෙනත් වෘත්තීය අවශ්‍යතා හෝ නීතියෙන් හෝ නියාමනයේ අවශ්‍යතා අදාල වන බවට ප්‍රකාශයක්. වෘත්තිකයා වෘත්තීය ගණකාධිකාරීවරයෙකු නොවේ නම්, ප්‍රකාශය අවම වශයෙන් SLSQC 1 තරමට ඉල්ලුමක් ඇති වෘත්තීය අවශ්‍යතා හෝ නීතියේ හෝ නියාමනයේ අවශ්‍යතා හඳුනා ගනි;

(ඛ) කාර්යයභාරයේ නියමයන්ට එකඟ වූ පරිදි ක්‍රියාපටිපාටියේ ස්වභාවය සහ ප්‍රමාණය විස්තර කරමින් සිදු කරන ලද ක්‍රියාපටිපාටි පිළිබඳ විස්තරයක්, සහ අදාල නම්, කාර්යයභාර නියමයන්ට එකඟවූ පරිදි එක් එක් ක්‍රියාපටිපාටියේ කාල වකවානුව; (යොමුව: අ55 - අ57 ඡේද);

(ග) සොයාගත් ව්‍යතිරේඛ මත විස්තර ඇතුලත්ව ඉටුකළ එක් එක් පටිපාටියේ සොයා ගැනීම් (යොමුව: අ55 - අ56 ඡේද);

(ඝ) වෘත්තිකයාගේ අත්සන;

(ච) එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ දිනය; හා

(ඡ) වෘත්තිකයා පරිචයේ යෙදෙන අධිකරණ බල ප්‍රදේශයේ පිහිටීම.

31. වෘත්තිකයා එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ වෘත්තිකයෙකුගේ විශේෂඥයෙකු විසින් සිදු කරන ලද කාර්යය ගැන සඳහන් කරන්නේ නම්, විශේෂඥයෙකුගේ මැදිහත් වීමෙන් ක්‍රියාපටිපාටි සිදු කිරීම සහ සොයා ගැනීම් වාර්තා කිරීම සඳහා වෘත්තිකයාගේ වගකීම අඩු වන බව වාර්තාවේ වචනවලින් ඇඟවෙන්නේ නැත. (යොමුව: අ58 ඡේදය).

32. 30(ඛ) ඡේදය මඟින් අවශ්‍ය වන පරිදි සොයාගැනීම් විස්තර කිරීමට අමතරව, වෘත්තිකයා එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ සොයාගැනීම්වල සාරාංශයක් සපයන්නේ නම්:

(අ) සොයාගැනීම්වල සාරාංශය අරමුණුගත ආකාරයෙන් විස්තර කළයුතු අතර, පැහැදිලි, නොමඟ යවන සුළු නොවන සහ විවිධ අර්ථකථනවලට යටත් නොවීම; හා

(ආ) එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ සාරාංශය කියවීම, සම්පූර්ණ වාර්තාව කියවීම සඳහා ආදේශකයක් නොවන බව පෙන්වන ප්‍රකාශයක් ඇතුලත් විය යුතුය.

33. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූලව වෘත්තිකයා විසින් එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව දාතම කල යුත්තේ වෘත්තිකයා එකඟ වූ පටිපාටි සම්පූර්ණ කර සොයාගැනීම් තීරණය කරන ලද දිනයට වඩා කලින් නොවේ.

**එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක්, වෙනත් කාර්යයභාරක් සමඟ එකව භාර ගැනීම**

34. එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව අනෙකුත් කටයුතු පිළිබඳ වාර්තාවලින් පැහැදිලිව වෙන්කොට හඳුනාගත යුතුය. (යොමුව: අ59 ඡේදය)

**ලේඛනගත කිරීම**

35. වෘත්තිකයා කාර්යයභාරයේ ලේඛනවලට ඇතුලත් කළයුතු වන්නේ: (යොමුව: අ60 ඡේදය)

(අ) කාර්යයභාරයේ ලිඛිත කොන්දේසි සහ අදාල නම්, ක්‍රියාපටිපාටිවල වෙනස් කිරීම් සම්බන්ධයෙන් සහභාගි වන පාර්ශවයේ එකඟතාවය;

(ආ) ඉට කරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටිවල ස්වභාවය, කාලය සහ ප්‍රමාණය; හා

(ඇ) ඉටු කරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටි වල ප්‍රතිඵලයක් වශයෙන් වූ සොයා ගැනීම්.

***

**මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි විෂයපථය ව්‍යවහාරය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ දේවල්**

**(යොමුව 2 ඡේදය)**

අ1. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි "විෂය කරුණු" වෙත යොමු කිරීමට අදාල වන පරිදි තොරතුරු, ලේඛන, මිනුම් හෝ නීති සහ රෙගුලාසිවලට අනුකූලවීම ඇතුළුව එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කරනු ලබන ඕනෑම දෙයක් ඇතුලත් වේ.

අ2. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක ඉටු කල හැකි මූල්‍ය සහ මූල්‍ය නොවන විෂය කරුණුවලට ඇතුලත් උදාහරණ:

- සම්බන්ධ මූල්‍ය විෂය කරුණු:
  - o අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ හෝ විශේෂිත පන්තියේ ගණුදෙනු, ගිණුම් ශේෂයන් හෝ මූල්‍ය ප්‍රකාශ තුල හෙලිදරව් කිරීම්.
  - o අරමුදල් වැඩ සටහනකින් ඉල්ලා සිටින වියදම් සඳහා සුදුසුකම්.
  - o අයභාර ප්‍රතිශතයක් මත පදනම් වූ රාජ්‍ය භාග, කුලී හෝ බලයලත් ගාස්තු තීරණය කිරීම සඳහා අයභාරය.
  - o නියාමන අධිකාරීන් සඳහා ප්‍රාග්ධන ප්‍රමාණවත් බවේ අනුපාත.
- සම්බන්ධ මූල්‍ය නොවන විෂය කරුණු :
  - o සිවිල් ගුවන් සේවා අධිකාරියකට වාර්තාකල මඟීන් සංඛ්‍යාව.
  - o නියාමන අධිකාරියකට වාර්තා කරන ලද ව්‍යාජ හෝ දෝෂ සහිත භාණ්ඩ විනාශ කිරීම නිරීක්ෂණය කිරීම.
  - o නියාමන අධිකාරියකට වාර්තා කරන ලද ලොතරැයි දිනුම් ඇදීම් සඳහා දත්ත උත්පාදන ක්‍රියාවලි.
  - o නියාමන අධිකාරියකට වාර්තා කරන ලද හරිතාගාර වායු විමෝචන පරිමාව.

ඉහත ලැයිස්තුව සම්පූර්ණ එකක් නොවේ. බාහිර වාර්තාකරණ ඉල්ලීම් වෙනස් වන විට අමතර විෂය කරුණු මතුවිය හැකිය.

*SLSQC 1* සමඟ සම්බන්ධතාවය

(යොමුව: 3 ඡේදය)

අ3. *SLSQC 1*, එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් ඇතුළුව අදාල සේවා කටයුතු සඳහා එහි තත්ත්ව පාලන පද්ධතිය ස්ථාපිත කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා සමාගමේ වගකීම් සමඟ කටයුතු කරයි. එම වගකීම් ස්ථාපිත කිරීම සඳහා යොමුකර ඇත්තේ :

- ආයතනයේ තත්ත්ව පාලන පද්ධතිය; හා
- තත්ත්ව පාලන පද්ධතියේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම් කර ඇති, ආයතනයට අදාල ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා එහි ක්‍රියාපටිපාටි.

අ4. *SLSQC 1* යටතේ, ආයතනයට සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා තත්ත්ව පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමට සහ නඩත්තු කිරීමට බැඳීමක් තිබේ :

(අ) අස්තිත්ත්වය සහ එහි කාර්ය මණ්ඩලය, වෘත්තීය ප්‍රමිතීන්ට සහ අදාල නීතිමය හා නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම; හා

(ආ) ආයතනය හෝ හවුල් කරුවන් විසින් නිකුත් කරන ලද වාර්තා තත්ත්වයන් තුල යෝග්‍ය වීම.[2]

[2] *SLSQC 1* 11 ඡේදය

අ5. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන්ට අදාලව SLSQC 1 සම්මත කර නොමැති අධිකරණ බල ප්‍රදේශයක් එවැනි කටයුතු සිදු කරන සමාගම්වල තත්ත්ව පාලනය සඳහා අවශ්‍යතා නියම කළ හැකිය. කාර්යයභාර මට්ටමෙන් තත්ත්ව පාලනය සම්බන්ධයෙන් මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි විධි විධාන පදනම් වන්නේ සම්මත කර ඇති තත්ත්ව පාලන අවශ්‍යතා අවම වශයෙන් SLSQC 1 හි අවශ්‍යතා තරම් ඉල්ලුමක් පවතින පදනම මතය. පහත සඳහන් එක් එක් මූලිකාංග ආමන්ත්‍රණය කරන ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ඇතුලත් තත්ත්ව පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමේ වගකීම ඇතුළුව ශ්‍රී ලංකා තත්ත්ව පාලනය පිළිබඳ ප්‍රමිතිය SLSQC 1 හි අවශ්‍යතාවල අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගමට බැඳීම් පැනවූ විට මේවා සාක්ෂාත් කරගනු ලැබේ:

- ආයතනය තුල ගුණාත්මක භාවය සඳහා නායකත්ත්ව වගකීම්;
- අදාල සදාචාරාත්මක අවශ්‍යතා;
- සේවාදායක සබඳතා සහ නිශ්චිත නියැලීම් පිළිගැනීම සහ අඛන්ඩව පවත්වාගෙන යාම;
- මානව සම්පත්;
- කාර්යයභාරයේ කාර්ය සාධනය; සහ
- අධීක්ෂණය.

අ6. ආයතනයතත්ත්ව පාලන පද්ධතියේ සන්දර්භය තුල, කාර්යයභාරයට අදාල තත්ත්ව පාලන ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමේ වගකීමක් කාර්යයභාර කණ්ඩායම් වලට ඇත.

අ7. සමාගම හෝ වෙනත් පාර්ශවයන් විසින් සපයනු ලබන තොරතුරු වෙනත් ආකාරයකින් යෝජනා කරන්නේ නම් මිස, සමාගමේ තත්ත්ව පාලන පද්ධතිය මත විශ්වාසය තැබීමට සම්බන්ධිත කණ්ඩායමට හිමිකම් ඇත. උදාහරණයක් ලෙස, කාර්යයභාර කණ්ඩායමට අදාලව සමාගමේ තත්ත්ව පාලන පද්ධතිය මත විශ්වාසය තැබිය හැක:

- බඳවා ගැනීම් සහ විධිමත් පුහුණුව තුලින් පුද්ගලයින්ගේ නිපුනතාවය.
- පිළිගැනීම සහ අඛන්ඩ පද්ධති හරහා සේවාදායක සබඳතා පවත්වාගෙන යාම.
- අධීක්ෂණ ක්‍රියාවලිය හරහා නීතිමය හා නියාමන අවශ්‍යතා පිළිපැදීම.

එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයට බලපෑහැකි තත්ත්ව පාලන ක්‍රමයේ හඳුනාගෙන ඇති දුර්වලතා සළකා බැලීමේදී, හවුල්කරු විසින් එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ සන්දර්භය තුල ප්‍රමාණවත් යැයි සළකන තත්ත්වය නිවැරදි කිරීමට සමාගම විසින් ගනු ලබන ක්‍රියා මාර්ග සළකා බැලිය හැකිය.

අ8. සමාගමේ තත්ත්ව පාලන පද්ධතියේ අඩුපාඩුවක්, වෘත්තීය ප්‍රමිතීන්ට සහ අදාල නෛතික හා නියාමන අවශ්‍යතා වලට අනුකූලව එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් සිදු නොකළ බව හෝ එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව සුදුසු නොවන බව අවශ්‍යයෙන්ම ඇඟවෙන්නේ නැත.

**බලාත්මක දිනය (යොමුව : 11 ඡේදය)**

අ9. වසර ගණනාවක් ආවරණය වන කාර්යයභාර නියමයන් සඳහා බලාත්මක වන දිනට හෝ ඉන් පසුව මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි අනුව එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් ඉටු කෙරෙන පරිදි, වෘත්තිකයින් බැඳීමේ නියමයන් යාවත්කාලීන කිරීමට කැමති විය හැකිය.

**නිර්වචන**

*කාර්යයභාරයේ පාර්ශවය හා වෙනත් අපේක්ෂිත පරිශීලකයින් (යොමුව : 13(අ), 13(ආ), 13(ඇ) 13(උ), 24(ඊ)(i), 24(උ), 30(ඉ)(i), 30(ඉ)(iii) ඡේද)*

අ10 සමහර තත්ත්වයන් තුල දී ක්‍රියාපටිපාටිවල කාර්යයභාර පාර්ශවයට අමතරව, අපේක්ෂිත පරිශීලකයින් සමඟ එකඟ විය හැකිය. ක්‍රියාපටිපාටිවල යෝග්‍යතාවය කාර්යයභාරයේ පාර්ශවය හැර වෙනත් අපේක්ෂිත පරිශීලකයින්ද පිළිගත හැකිය.

අ11 කාර්යයභාරයේ පාර්ශවය, විවිධ තත්ත්වයන් යටතේ වගකිව යුතු පාර්ශවය, නියාමකයෙකු හෝ වෙනත් අපේක්ෂිත පරිශීලකයෙකු විය හැකිය. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි යෙදෙන නියැලීමේ පාර්ශවය වෙත යොමු වීමේදී, අදාල වන විට බහුවිධ නියැලීමේ පාර්ශවයන්ද ඇතුලත් වේ.

*සොයාගැනීම් (යොමුව: 13(ඊ) ඡේදය)*

අ12. සොයාගැනීම් අරමුණුගතව සත්‍යාපනය කිරීමට හැකියාව ඇති අතර, එයින් අදහස් වන්නේ එකම ක්‍රියාපටිපාටි සිදු කරන විවිධ වෘත්තිකයින් සමාන ප්‍රතිඵල ලබා ගැනීමට අපෙක්ෂා කරන බවයි. සොයා ගැනීම් මඟින් මතයක් හෝ නිගමනයක් ප්‍රකාශ කිරීම මෙන්ම වෘත්තිකයා විසින් කළ හැකි ඕනෑම නිර්දේශයක් බැහැර කරයි.

අ13. වෘත්තිකයින්ට "සොයා ගැනීම්" ස්ථානයේ "සත්‍ය සොයා ගැනීම්" යන යෙදුම භාවිතා කල හැකිය. උදාහරණයක් ලෙස, "සොයා ගැනීම්" යන යෙදුම වරදවා වටහා ගත හැකි බවට වෘත්තිකයා සැළකිලිමත් වන අවස්ථාවලදී වේ. "සොයා ගැනීම්" යන යෙදුමෙහි සත්‍ය නොවන ප්‍රතිඵල ඇතුලත් ලෙසට තේරුම් ගත හැකි අධිකරණ බල ප්‍රදේශවල හෝ භාෂාවල මෙය මෙසේ විය හැකිය.

## අදාල ආචාර ධර්ම අවශ්‍යතා (යොමුව : 17 ඡේදය)

*අරමුණුගත බව සහ ස්වාධීනත්වය*

ආ14. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් ඉටු කරන වෘත්තිකයෙකු ආදාල ආචාර ධර්ම අවශ්‍යතාවලට අනුකුල වීම අවශ්‍ය වේ. අදාල ආචාරධර්ම අවශ්‍යතා සාමාන්‍යයෙන් CA ශ්‍රී ලංකා සංග්‍රහය සමඟ වඩා සීමාකාරී ජාතික අවශ්‍යතා සමඟින් සමන්විත වේ. CA ශ්‍රී ලංකා සංග්‍රහය මඟින් වෘත්තිකයින්ට අරමුණුගත බව ඇතුළු මූලික මූලධර්මවලට අනුකුලවීම අවශ්‍ය වන අතර, පක්ෂග්‍රාහිත්වය, උනන්දුව අතර ගැටුම හෝ අන් අයගේ අනිසි බලපෑම හේතුවෙන් වෘත්තිකයින්ට තම වෘත්තීය හෝ ව්‍යාපාරික විනිශ්චයට බාධා නොකිරීමට අවශ්‍ය වේ. ඒ අනුව, වෘත්තිකයා යටත් වන අදාල ආචාර ධර්ම අවශ්‍යතා එකඟ වූ ක්‍රියා පටිපාපටි කාර්යයභාරයක් ඉටු කිරීමේදී අවම වශයෙන් වෘත්තිකයා අරමුණුගත විය යුතුය.

අ15 CA ශ්‍රී ලංකා සංග්‍රහයේ එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරය සඳහා ස්වාධීන අවශ්‍යතා අඩංගු නොවේ. කෙසේ වෙතත්, ජාතික ආචාරධර්ම සංග්‍රහ, නීති හෝ නියාමන, වෙනත් වෘත්තීය අවශ්‍යතා හෝ ගිවිසුමක කොන්දේසි, වැඩ සටහනක් හෝ එකඟ වූ ක්‍රියාපටිපාටි නියැලීම සඳහා විෂය කරුණුවලට අදාල විධි විධාන ස්වාධීනත්වයට අදාල අවශ්‍යතා නියම කළ හැකිය.

*නීති හා රෙගුලාසි වලට අනුකුල නොවීම*[3]

අ16 නීතිය, නියාමනය හෝ අචාරධර්ම අවශ්‍යතා විය හැක්කේ:

(අ) හඳුනාගෙන ඇති හෝ සැක කරන නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම පිළිබඳව අස්තිත්ත්වයෙන් පිටත සුදුසු අධිකාරියකට වාර්තා කරන ලෙස වෘත්තිකයාගෙන් ඉල්ලා සිටීම.

(ආ) අස්තිත්ත්වයෙන් පිටත සුදුසු අධිකාරියකට වාර්තා කිරීමේදී තත්ත්වයන් යටතේ සුදුසු විය හැකි වගකීම් ස්ථාපිත කිරීම[4]

අ17 හඳුනාගෙන ඇති හෝ සැක කරන නීති හා රෙගුලාසිවලට අනුකුල නොවීම පිළිබඳව අස්තිත්ත්වයෙන් පිටත සුදුසු අධිකාරියකට වාර්තා කිරීම අවශ්‍ය හෝ සුදුසු තත්ත්වයන් යටතේ සිදුවිය හැක්කේ: පහත දෑ නිසාය

(අ) නීතිය, නියාමනය හෝ අදාල ආචාරධර්ම අවශ්‍යතාවයන් අනුව වෘත්තිකයාට වාර්තා කිරීමට අවශ්‍ය වීම;

(ආ) අදාල අචාරධර්ම අවශ්‍යතාවලට අනුකූලව හඳුනාගත් හෝ සැක කරන ලද නොගැලපීම්වලට ප්‍රතිචාර දැක්වීමට වාර්තා කිරීම සුදුසු ක්‍රියාවක් ලෙස වෘත්තිකයා තීරණය කර තිබීම; හෝ

(ඇ) නීතිය, නියාමනය හෝ ආචාර ධර්ම අවශ්‍යතා වෘත්තිකයාට එසේ කිරීමට අයිතිය ලබාදීම.

අ18. එකඟ වූ ක්‍රියපටිපාටි කාර්යයභාරය ඉටු කිරීමට අවශ්‍ය විය හැකි ප්‍රමාණයෙන් ඔබ්බට නීති සහ නියාමන පිළිබඳ අවබෝධයක් වෘත්තිකයාට ඇතැයි අපේක්ෂා නොකෙරේ. කෙසේවෙතත්, නීතිය, නියාමනය හෝ අදාල ආචාර

3 නීති හා නියාමන වලට අනුකුල නොවීමේදී වංචාව ඇතුලත් බව අදල ආචාර ධර්ම අවශ්‍යතා පෙන්නුම් කරයි.

4 (ඉවත් කරන ලදී).

ධර්ම අවශ්‍යතා, හඳුනාගෙන ඇති හෝ සැක කරන අනුකූල නොවන බවට ප්‍රතිචාර දැක්වීම සඳහා දැනුම, වෘත්තීය විනිශ්චය සහ විශේෂඥභාවය යෙදීමට වෘත්තිකයා අපේක්ෂා කරයි. පනතකට සත්‍ය ලෙස අනුකූල නොවීම සමන්විත වන්නේද යන්න අවසානයේ අධිකරණයක් හෝ වෙනත් සුදුසු විනිශ්චය මණ්ඩලයක් විසින් තීරණය කළ යුතු කාරණයකි.

අ19. සමහර තත්ත්වයන් තුලදී, හඳුනාගෙන ඇති හෝ සැක කරන ලද නීති හා නියාමන වලට අනුකූල නොවීම පිළිබඳව අස්තිත්ත්වයෙන් පිටත සුදුසු අධිකාරියකට වාර්තා කිරීම, නීතිය, නියාමනය හෝ අචාරධර්ම අවශ්‍යතා යටතේ රහස්‍යභාවය පිළිබඳ වෘත්තිකයාගේ රාජකාරියන් වැළැක්විය හැකිය. වෙනත් අවස්ථාවලදී, හඳුනාගෙන ඇති හෝ අනුකූල නොවන බවට සැක කරන බව අස්තිත්ත්වයෙන් පිටත සුදුසු අධිකාරියකට වාර්තා කිරීම අදාල ආචාරධර්ම අවශ්‍යතා යටතේ රහස්‍යභාවයේ යුතුකම කඩ කිරීමක් ලෙස නොසැළකේ.[4]

අ20. වෘත්තිකයාට අභ්‍යන්තරව උපදේශනය (උදාඃ සමාගම හෝ ජාල සමාගම තුල) කිසියම් නිශ්චිත ක්‍රියා මාර්ගයක් ගැනීමේ වෘත්තීය හෝ නීතිමය ඇඟවීම් තේරුම් ගැනීමට නීති උපදෙස් ලබා ගැනීම හෝ නියාමකයෙකු හෝ වෘත්තීය ආයතනයක් සමඟ රහසිගත පදනමක් මත උපදේශනය සළකා බැලිය හැක. (එසේ කිරීම, නීතියෙන් හෝ නියාමන රෙගුලාසි මගින් තහනම් කර ඇත්නම් හෝ රහස්‍යභාවයේ යුතුකම කඩ කරන්නේ නම් මිස).[5]

**වෘත්තීය විනිශ්චය (යොමුව : 18 ඡේදය)**

අ21. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි අවශ්‍යතා සහ අදාල ආචාර ධර්ම අවශ්‍යතා ව්‍යවහාර කිරීම්දී සහ සුදුසු පරිදි එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාර පුරාවට ක්‍රියා මාර්ග පිළිබඳ දැනුවත් තීරණ ගැනීමේදී වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක වේ.

අ22. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් මත පිළිගැනීමේදී, සිදුකිරීම්දී සහ වාර්තා කිරීමේදී වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරනු ලැබේ. උදාහරණයක් ලෙසඃ

කාර්යයභාරය පිළිගැනීම

- ඉටුකළ යුතු ක්‍රියාපටිපාටිවල ස්වභාවය, කාලය සහ ප්‍රමාණය සම්බන්ධිත පාර්ශවය (සහ අදාල නම්, වෙනත් පාර්ශව) සමඟ සාකච්ඡා කිරීම සහ එකඟ වීම. (කාර්යයභාරයේ අරමුණ සැළකිල්ලට ගනිමින්).
- කාර්යයභාරය පිළිගැනීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාමේ කොන්දේසි සපුරා තිබේද යන්න තීරණය කිරීම.
- වෘත්තිකයෙකුගේ විශේෂඥයකු සම්බන්ධ කර ගැනීමේ අවශ්‍යතාවය ඇතුළුව, කාර්යයභාරයේ නියමයන් තුල එකඟ වූ පරිදි ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් තීරණය කිරීම.
- එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා වෘත්තිකයාගෙන් එකඟවන ලෙස ඉල්ලා සිටින ක්‍රියාපටිපාටි නුසුදුසු බවට යෝජනා කරන කරුණු හෝ තත්ත්වයන් පිළිබඳව වෘත්තිකයා දැනුවත් වුවහොත් සුදුසු ක්‍රියා මාර්ග තීරණය කිරීම.

කාර්යයභාරය සිදු කිරීම

- එකඟ වූ ක්‍රියාපටිපාටි සිදු කරන විට, වෘත්තිකයා දැනුවත් වන්නේ නම්, සුදුසු ක්‍රියා හෝ ප්‍රතිචාර තීරණය කිරීමඃ
  - o වංචාවක් හෝ නීති හෝ නියාමනවලට අනුකූල නොවන බවට සැක කෙරෙන හෝ අනුකූල නොවන අවස්ථාවක් පෙන්නුම් කළ හැකි කරුණු.
  - o එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයට අදාල තොරතුරුවල අඛන්ඩතාව පිළිබඳ සැක මතු කරන හෝ තොරතුරු නොමඟ යවන සුළු බව පෙන්නුම් කරන වෙනත් කරුණු.
  - o එකඟ වූ පරිදි ඉටු කල නොහැකි ක්‍රියාපටිපාටි.

---

4 *(ඉවත් කරන ලදී)*

5 *(ඉවත් කරන ලදී).*

කාර්යයභාරය පිළිබඳ වාර්තා කිරීම

- සොයාගත් ව්‍යාතිරේඛ සොයා ගැනීම් ඇතුළුව, ප්‍රමාණවත් විස්තර සහිතව සහ වෙනස් ආකාරයෙන් විස්තර කිරීම.

අ23. එකඟ වු ක්‍රියාපටිපාටි කාර්යයභාරය ඉටු කිරීමේදී, එකඟ වු ක්‍රියාපටිපාටි ඉටු කිරීමේදී වෘත්තිකයාට වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පහත සඳහන් හේතු නිසා සීමා වේ:

- එකඟ වු ක්‍රියාපටිපාටි කාර්යයභාරයකට වෘත්තිකයා සහ නියැලෙන පාර්ශවය විසින් එකඟ වු ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම ඇතුලත් වන අතර, එහිදී සිදුකරන ලද ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා යෝග්‍ය බව නියැලෙන පාර්ශවය පිළිගෙන ඇත.
- එකග වු ක්‍රියාපටිපාටි සහ එම ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලය වන සොයා ගැනිම් අරමුණු ගතව, පැහැදිලි නියමයන්ට අනුව, නොමඟ යවන සුළු නොවන අතර, විවිධ අර්ථකථනවලට යටත් නොවේ.
- සොයා ගැනීම් අරමුණු ගතව සත්‍යාපනය කිරීමට හැකියාව ඇති අතර, එයින් අදහස් වන්නේ එකම ක්‍රියාපටිපාටි සිදු කරන විවිධ වෘත්තිකයින් සමාන ප්‍රතිඵල ලබා ගැනීමට අපේක්ෂා කරන බවයි.

**කාර්යයභාර මට්ටමේ තත්ත්ව පාලනය** (යොමුව: 19 - 20 ඡේද)

අ24. කාර්යයභාර හවුල්කරුගේ ක්‍රියාවන් සහ කාර්යයභාර කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට සුදුසු පණිවිඩ, එක් එක් කාර්යයභාරයේ සමස්ත ගුණාත්මකභාවය පිළිබඳ වගකීම භාර ගනිමින්, කාර්යයභාරයේ ගුණාත්මක භාවය සාක්ෂාත් කර ගැනීමේ වැදගත්කම අවධාරණය කරයි:

(අ) වෘත්තීය ප්‍රමිතීන් සහ නියාමන හා නීතිමය අවශ්‍යතාවලට අනුකූල වන කාර්යයන් ඉටු කිරීම;

(ආ) අදාල වන පරිදි සමාගමේ තත්ත්ව පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලට අනුකූලවීම; හා

(ඇ) මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුව කාර්යයභාරය සඳහා වෘත්තිකයාගේ වාර්තාව නිකුත් කිරීම.

අ25 SLSQC 1 අවශ්‍යතා අනුව ආයතනය විසින් නව සේවාදායකයෙකු සමඟ කාර්යයභාරය පිළිගැනීමට පෙර, දැනට පවතින කාර්යයභාරන් දිගටම කරගෙන යා යුතුද යන්න තීරණය කිරීමේදී සහ දැනට සිටින සේවාදායකයෙකු සමඟ නව කාර්යයභාරයක් පිළිගැනීම සළකා බැලීමේදී අවශ්‍ය යැයි සළකන තොරතුරු ලබා ගැනීම අවශ්‍ය වේ. සේවාදායක සබඳතා පිළිගැනීම හෝ අඛණ්ඩව පවත්වා ගැනීම සහ එකඟ වු ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් යෝග්‍ය ද යන්න තීරණය කිරීමේදී කාර්යයභාර හවුල්කරුට සහාය වන තොරතුරුවලට ප්‍රධාන හිමිකරුවන්ගේ, ප්‍රධාන කළමනාකාරිත්වයේ සහ පාලනයට සම්බන්ධ අයගේ අවංකභාවය පිළිබඳව තොරතුරු ඇතුලත්විය හැකිය. කාර්යයභාර හවුල්කරුට කළමනාකාරිත්වයේ අවංකභාවය පිළිබඳව යම් මට්ටමකට සැක කිරීමට හේතුවක් තිබේ නම්, එය කාර්යයභාරයේ නිසි කාර්යසාධනයට බලපාන බැවින් කාර්යයභාරය පිළිගැනීම සුදුසු නොවිය හැකිය.

අ26 SLSQC 1 මඟින් සමාගම සහ එහි කාර්ය මණ්ඩලය අදාල ආචාර ධර්ම අවශ්‍යතාවලට අනුකූල වන බවට සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා සැලසුම් කර ඇති ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ස්ථාපිත කිරීම සඳහා ආයතනයෙහි වගකීම් දක්වා ඇත. මෙම ශ්‍රී ලංකා ප්‍රමිතිය මඟින් අදාල ආචාරධර්ම අවශ්‍යතා සමඟ කාර්යභාර කණ්ඩායම අනුකූලවීම සම්බන්ධයෙන් කාර්යයභාර හවුල්කරුගේ වගකීම් සඳහන් කරයි.

අ27 20 ඡේදයේ අවශ්‍යතාවය සපුරාලීමට වෘත්තිකයාට නොහැකි නම්, වෘත්තිකයාට නිසි ලෙස වගකීම භාරගත හැකි ක්‍රියාපටිපාටිවලට එකඟ වු ක්‍රියාපටිපාටි වල විෂයපථය සීමා කිරීමට සම්බන්ධිත පාර්ශවය සමඟ එකඟවීම සුදුසු විය හැකිය. කාර්යයභාරයේ නිරත පාර්ශවයට අනෙකුත් ක්‍රියපටිපාටි සිදු කිරීම සඳහා විශේෂඥයෙකු වෙනම සම්බන්ධ කරගත හැකිය.

**කාර්යයභාරය පිළිගැනීම සහ අඛණ්ඩව පවත්වාගෙන යෑම (යොමුව: 21-23 ඡේද)**

අ28 එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේදී, එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා වෘත්තිකයාගෙන් ඉල්ලා සිටිනු ලබන ක්‍රියාපටිපාටි නුසුදුසු බවට වූ ඇඟවීම් පිළිබඳව වෘත්තිකයා දැනුවත් විය හැකිය. උදාහරණයක් ලෙස, පහත දැක්වෙන කරුණු හෝ තත්ත්වයන් පිළිබඳව වෘත්තිකයා දැනුවත් විය හැකිය:

- ක්‍රියාපටිපාටි තෝරාගනු ලබන්නේ අපේක්ෂිත පරිශීලකයින්ගේ තීරණ ගැනීම පක්ෂග්‍රාහී කිරීමට අදහස් කරන ආකාරයටය.
- සිදු කරනු ලබන එකඟ වූ ක්‍රියාපටිපාටි විෂය කරුණු විශ්වාස කළ නොහැකි වීම.
- සහතික කිරීමේ කාර්යයභාරයක් හෝ උපදේශන සේවාවක් මඟින් කාර්යයභාරයේ නිරත පාර්ශවයේ හෝ වෙනත් අපේක්ෂිත පරිශීලකයින්ගේ අවශ්‍යතා වඩාත් හොඳින් ඉටුකළ හැකිය.

අ29. 21 සහ 22 ඡේදවල කොන්දේසි සපුරා ඇති බවට වෘත්තිකයා තෘප්තිමත් කළ හැකි වෙනත් ක්‍රියාවලට ඇතුළත් වන්නේ:

- ලිඛිත අවශ්‍යතා සමඟ ඉටු කළයුතු ක්‍රියාපටිපාටි සංසන්දනය කිරීම, උදාහරණයක් ලෙස, සුදුසු අවස්ථාවලදී, නීතියේ හෝ නියාමනයේ හෝ ගිවිසුම්ගත කාර්යයභාරයක් (සමහර විට "යොමු නියමයන්" ලෙස හැඳින්වේ.)
- කාර්යයභාරයේ නිරත පාර්ශවයට ඉල්ලීම්:
    - o අපේක්ෂිත පරිශීලකයා(යන්) වෙත කාර්යයභාර නියමයන්හි දක්වා ඇති පරිදි සකස් කරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ අන්තර්ගතය සහ අපේක්ෂිත ක්‍රියාපටිපාටි වල පිටපතක් හා පෝරමය බෙදා හැරීම.
    - o අපේක්ෂිත පරිශීලකයා(යන්) ගෙන් ඉටු කළ යුතු ක්‍රියාපටිපාටි පිළිබඳව පිළිගැනීමක් ලබාගැනීම.
    - o අපේක්ෂිත පරිශීලකයා(යන්) ගේ සුදුසු නියෝජිතයින් සමඟ සිදුකළයුතු ක්‍රියාපටිපාටි පිළිබඳව සාකච්ඡා කිරීම.
- කාර්යයභාරයේ නිරත පාර්ශවය එකම අපේක්ෂිත පරිශීලකයා නොවේ නම්, කාර්යයභාරයේ නිරත පාර්ශවය සහ අනෙකුත් අපේක්ෂිත පරිශීලකයින් අතර හුවමාරු වූ ලිපි කියවීම.

අ30. 21 සහ 22 ඡේදවල කොන්දේසි සපුරා නොමැති නම්, එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක කාර්යයභාරයේ සම්බන්ධිත පාර්ශවයේ හෝ වෙනත් අපේක්ෂිත පරිශීලකයින්ගේ අවශ්‍යතා සපුරාලීමට හැකියාවක් නැත. එවැනි තත්ත්වයන් තුළ, වෘත්තිකයා වඩාත් සුදුසු විය හැකි සහතික කාර්යයභාරයක් වැනි වෙනත් සේවාවන් යෝජනා කළ හැකිය.

අ31. 21 සහ 22 ඡේදවල ඇති සියළුම කොන්දේසි කාර්යයභාරයේ කාලය තුළ එකතු කරන ලද හෝ සංශෝධනය කරන ලද ක්‍රියාපටිපාටි සඳහා ද අදාල වේ.

*එකඟ වූ ක්‍රියාපටිපාටි සහ සොයාගැනීම් පිළබඳ විස්තර (යොමුව: 22(ඇ) ඡේදය)*

අ32. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක ඉටු කළයුතු ක්‍රියාපටිපාටි නීතියන් හෝ නියාමනයෙන් නියම කළ හැකිය. සමහර තත්ත්වයන් තුළ, එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ ක්‍රියාපටිපාටි හෝ සොයා ගැනීම් විස්තර කළ යුතු ආකාරය නීතිය හෝ නියාමනය මඟින් නියම කළ හැක. 22(ඇ) ඡේදයේ දක්වා ඇති පරිදි එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් පිළිගැනීමේ කොන්දේසියක් වනුයේ එකඟ වූ ක්‍රියාපටිපාටි සහ සොයා ගැනීම් අරමුණුගතව පැහැදිලි නියමයන්ට අනුව, නොමඟ යවන සුළු නොවන සහ විවිධ අර්ථකථනවලට යටත් නොවන බවට වෘත්තිකයා තීරණය කර තිබීමයි.

අ33. එකඟ වූ ක්‍රියාපටිපාටි අරමුණුගතව, පැහැදිලි නියමයන්ට අනුව, නොමඟ යවන සුළු නොවන සහ විවිධ අර්ථකථනවලට යටත් නොවන පරිදි විස්තර කෙරේ. මෙයින් අදහස් කරන්නේ ඒවායින් විස්තර කර ඇත්තේ අපේක්ෂිත පරිශීලකයෙකුට ස්වභාවය හා ප්‍රමාණය සහ අදාල නම්, සිදු කරන ලද ක්‍රියාපටිපාටිවල වේලාව තේරුම් ගැනීමට ප්‍රමාණවත් නිශ්චිත මට්ටමකින් බවයි. සන්දර්භය හෝ එහි නොපැවතීම මත පදනම්ව, ඕනෑම නියමයක් අපැහැදිලි හෝ නොමඟ යවන සුළු ආකාරයෙන් භාවිත කළ හැකි බව හඳුනාගැනීම වැදගත් වේ. ඒවා භාවිතා කරන සන්දර්භය තුල නියමයන් යෝග්‍යයැයි උපකල්පනය කරමින් පිළිගත හැකි ක්‍රියාවන් පිළිබඳ උදාහරණ ඇතුලත් වේ :

- තහවුරු කිරීම.
- සැසඳීම.
- එකඟවීම.
- ලුහු බැඳීම.
- පරික්ෂා කිරීම.
- විමසීම.
- නැවත ගණනය කිරීම.
- නිරීක්ෂණය කිරීම.

අ34. අපැහැදිලි නොමඟ යවන සුළු හෝ ඒවා භාවිතා කරන සන්දර්භය අනුව විවිධ අර්ථකථනවලට යටත් විය හැකි නියමයන්, උදාහරණයක් ලෙසඃ

- ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් යටතේ "සාධාරණව ඉදිරිපත් කිරීම" හෝ "සත්‍ය හා සාධාරණ", "විගණනය", "සමාලෝචනය", "සහතික කිරීම". "මතය" හෝ "නිගමනය" වැනි සහතික හා සම්බන්ධ නියමයන්.

- සොයා ගැනීම් සම්බන්ධයෙන්, "අපි සහතික කරමු", "අපි සත්‍යාපනය කරමු", "අප තහවුරු කරගෙන තිබේ" හෝ "අපි සහතික කළෙමු" වැනි සහතික මතයක් හෝ නිගමනයක් ප්‍රකාශ කිරීම ඇඟවුම් කරන නියමයන්.

- "අපි සියළු පැහැදිලි කිරීම් ලබාගෙන අවශ්‍යයැයි සැළකූ ක්‍රියාපටිපාටි සිදු කළෙමු" වැනි අපැහැදිලි හෝ නොපැහැදිලි වාක්‍ය ඛණ්ඩ.

- "ප්‍රමාණාත්මක" හෝ "සැළකිය යුතු" වැනි විවිධ අර්ථකථනවලට යටත් වන නියමයන්.

- සිදු කලයුතු ක්‍රියාපටිපාටි වල ස්වභාවය සහ ප්‍රමාණය, අදාල නම් කාලය සඳහන් නොකර, "සාකච්ඡා", "ඇගයීම", "පරීක්ෂණය", "විශ්ලේෂණය" හෝ "පරීක්ෂා කිරීම" වැනි ක්‍රියාපටිපාටිවල අපැහැදිලි විස්තර උදාහරණයක් ලෙස, සාකච්ඡාව පවත්වන්නේ කා සමගද යන්න හෝ අසන ලද නිශ්චිත ප්‍රශ්න සඳහන් නොකර "සාකච්ඡා" යන වචනය භාවිතා කිරීම අපැහැදිලි විය හැකිය.

- "අපගේ මතය අනුව", "අපගේ දෘෂ්ඨි කෝණයෙන්" හෝ "අපි එම ස්ථාවරය ගනිමු" වැනි සොයා ගැනීම් සත්‍ය පිළිබිඹු නොකරන බවට යෝජනා කරන නියමයන්.

අ35. උදාහරණයක් ලෙසඃ "සමාලෝචන වියදම් ප්‍රතිපාදන සාධාරණද යන්න තීරණය කිරීම" වැනි ක්‍රියාපටිපාටියක නියමයන් පැහැදිලි වීමට, නොමඟ යවන සුළු නොවීමට හෝ විවිධ අර්ථකථනවලට යටත් නොවී සිටීමට වැනි කොන්දේසි සපුරාලීමට ඉඩක් ලැබී නැත්තේඃ

- ක්‍රියාපටිපාටි මඟින් එවැනි සහතිකයක් අපේක්ෂා නොකලද, සීමිත සහතික කිරීමකට පිරිවැය ප්‍රතිපාදන යටත් වූ බැවින් "සමාලෝචනය" යන පදය සමහර පරිශීලකයින් විසින් වැරදි ලෙස අර්ථකථනය කළ හැකිය.

- "සාධාරණ" යන යෙදුම "සාධාරණ" යනු කුමක්ද යන්න පිළිබඳව විවිධ අර්ථකථනවලට යටත්වේ.

අ36. තත්වයන් තුලදී නීතිය හෝ නියාමනය මඟින් ක්‍රියාපටිපාටියක් නියම කරන විට, හෝ අපැහැදිලි, නොමඟ යවන සුළු හෝ විවිධ අර්ථකථනවලට යටත් වන යෙදුම් භාවිතා කරමින් ක්‍රියාපටිපාටියක් විස්තර කරන විට, වෘත්තිකයාට 22(ඇ) ඡේදයේ කොන්දේසිය සපුරාලිය හැකිය. උදාහරණයක් ලෙස කාර්යයභාරයට සම්බන් ඉල්ලා සිටින්නේඃ

- ක්‍රියාපටිපාටිය හෝ ක්‍රියාපටිපාටියේ විස්තරය තවදුරටත් අපැහැදිලි, නොමඟ යවනසුළු විවිධ අර්ථ කථනවලට යටත් වන බැවින් එය සංශෝධනය කිරීම.

- අපැහැදිලි, නොමඟ යවන සුළු හෝ විවිධ අර්ථකථනවලට යටත් වන පදයක් සංශෝධනය කළ නොහැකි නම්, උදාහරණයක් ලෙස, නීතිය හෝ නියාමනය හේතුවෙන්, එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ එම පදයේ අර්ථ දැක්වීමක් ඇතුලත් කිරීම.

*ස්වාධීන අවශ්‍යතා සමඟ අනුකූල වීම (යොමුව: 22(ඉ) - 24(ඉ) ඡේද)*

අ37 අ15 ඡේදයේ දක්වා ඇති හේතු නිසා වෘත්තිකයාට ස්වාධීන අවශ්‍යතාවලට අනුකූල වීමට අවශ්‍ය වූ විට 22(ඉ) ඡේදය ව්‍යවහාර කරයි. 22(ඉ) ඡේදය ද ව්‍යවහාර කරන්නේ වෘත්තිකයා ස්වාධීන අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා කාර්යයභාරයේ නියමයන්ට අනුව කාර්යයභාරයේ නිරත පාර්ශවය සමඟ එකඟ වන විටය. උදාහරණයක් ලෙස, අදාල ආචාරධර්ම අවශ්‍යතා, නීතිය හෝ රෙගුලාසි හෝ වෙනත් අවශ්‍යතා වලට අනුකූල වීමට ස්වාධීන අවශ්‍යතා මත අවශ්‍ය නොවන බව වෘත්තිකයා මුලින් තීරණය කර තිබිය හැකිය. කෙසේ වෙතත්, කාර්යයභාරය පිළි ගැනීම සහ අඛණ්ඩව පවත්වා ගෙන යෑම හෝ කාර්යයභාරයේ නියමයන් හා එකඟ වීම ගැන සළකා බැලීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව වෘත්තිකයාගේ දැනුම, එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා යම් හඳුනාගත් ස්වාධීන අවශ්‍යතාවලට අනුකූලවීම යෝග්‍ය ද යන්න පිළිබඳව කාර්යයභාරයේ නිරත පාර්ශවය සමඟ සාකච්ඡාවක් පෙන්නුම් කළ හැකිය:

- එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ;
- කාර්යයභාරයේ නිරත පාර්ශවයේ, වෙනත් අපේක්ෂිත පරිශීලකයින්ගේ සහ වගකිවයුතු පාර්ශවයේ අන්‍යොන්‍යතාවය (සම්බන්ධිත පාර්ශවයට වඩා වෙනස්කම්);
- ඉටු කළයුතු ක්‍රියාපටිපාටිවල ස්වභාවය, කාලය සහ ප්‍රමාණය; හෝ
- කාර්යයභාරයේ නිරත පාර්ශවය, වෙනත් අපේක්ෂිත පරිශීලකයින් හෝ වගකිවයුතු පාර්ශවය (කාර්යයභාරයේ නිරත පාර්ශවයට වඩා වෙනස් නම්) වෙනුවෙන් වෘත්තිකයා සිදු කරන හෝ සිදුකර ඇති වෙනත් කාර්යයභාරයන්.

අ38. වෘත්තිකයා කාර්යයභාරයේ නිරත පාර්ශවයේ (හෝ කාර්යයභාරයේ නිරත පාර්ශවයට වඩා වෙනස් නම් වගකිව යුතු පාර්ශවයේ) මූල්‍ය ප්‍රකාශ වල විගණකවරයා විය හැකිය. එවැනි තත්ත්වයක් තුල, වෘත්තිකයා එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් ඉටු කිරීමට ද, නියැලී සිටී නම්, එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ අපේක්ෂිත පරිශීලකයින් විසින් එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා වෘත්තිකයා ස්වාධීන යැයි උපකල්පනය කළ හැකිය. එබැවින්, මූල්‍ය ප්‍රකාශවල විගණනයට අදාලවන ස්වාධීන අවශ්‍යතා සමඟ වෘත්තිකයාගේ අනුකූලතාවය එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා යෝග්‍ය බව වෘත්තිකයා නිරත වන පාර්ශවය සමඟ එකඟ විය හැකිය. එවැනි අවස්ථාවක, 24(ඉ) ඡේදයට අනුව, වෘත්තිකයා එවැනි ස්වාධීන අවශ්‍යතාවලට අනුකූල විය යුතු බවට ප්‍රකාශයක් කාර්යයභාරයේ නියමයන් තුල ඇතුලත් වේ.

**කාර්යයභාර නියමයන්ට එකඟ වීම** (යොමුව: 24 - 25 ඡේද)

අ39. අදාල වූ විට කාර්යයභාරයේ නිරත ලිපියෙහි අමතර කරුණු ඇතුලත් කළ හැකිය, උදාහරණයක් ලෙස:

- එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ සමහර පැතිකඩවලට වෘත්තිකයාගේ විශේෂඥයකුට ඇතුලත් වන විධි විධාන.
- එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව භාවිතා කිරීම හෝ බෙදාහැරීම යම් සීමාවන්.

අ40. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරය සඳහා නිදර්ශනාත්මක කාර්යයභාරයේ ලිපියක් 1 පරිශිෂ්ඨයෙහි දක්වා ඇත.

අ41. ව්‍යාතිරේඛ තීරණය කිරීම සඳහා ප්‍රමාණාත්මක සීමාවන් සිදුකල යුතු ක්‍රියාපටිපාටිවලට ඇතුලත් වන බවට වෘත්තිකයා නියුතු පාර්ශවය සමඟ එකඟ විය හැකිය. එසේනම්, මෙම ප්‍රමාණාත්මක සීමාවන් කාර්යයභාර නියමයන්හි ක්‍රියාපටිපාටි විස්තරවල ඇතුලත් වේ.

අ42. සමහර තත්ත්වයන් තුලදී, නීතිය හෝ නියාමනය මඟින් ඉටු කළ යුතු ක්‍රියාපටිපාටි වල ස්වභාවය පමණක් නියම කළ හැකිය. එවැනි තත්ත්වයන් තුල, 24(i) ඡේදයට අනුව, වෘත්තිකයා සම්බන්ධ වන පාර්ශවය සමඟ ඉටු කළයුතු ක්‍රියාපටිපාටි වල කාල සීමාව සහ ප්‍රමාණය එකඟ වන අතර, එමඟින් සිදු කළයුතු ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා යෝග්‍ය බව පිළිගැනීමට නියුක්තවසිටින පාර්ශවයට පදනමක් ඇත.

අ43. සමහර තත්ත්වයන් තුල, කාර්යයභාර නියමයන් සමඟ එකඟ වීම සහ එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කිරීම රේඛීය හා විවික්ත ආකාරයකින් සිදුවේ. වෙනත් තත්ත්වයන් තුල කාර්යයභාර නියමයන් එකඟ වීම සහ එකඟ වූ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම පුනරාවර්තන ක්‍රියාවලියක් වන අතර, හෙළිදරව් වන නව තොරතුරුවලට ප්‍රතිචාර වශයෙන් කාර්යයභාරයේ ප්‍රගතියක් සමඟ එකඟ වූ ක්‍රියාපටිපාටිවල වෙනස්කම් එකඟ වේ. කලින් එකඟ වී

ඇති ක්‍රියාපටිපාටි සංශෝධනය කිරීමට අවශ්‍ය නම්, 25 ඡේදයට මගින් අදාල සංශෝධිත නියමයන්ට සම්බන්ධිත පාර්ශවය සමඟ එකඟ විය යුතුය. සංශෝධිත කාර්යයභාරයේ නියමයන්, උදාහරණයක් ලෙස, යාවත්කාලීන කරන ලද කාර්යයභාර ලිපියක ආකෘතිය, පවතින කාර්යයභාර ලිපියකට අතිරේකයක් හෝ වෙනත් ලිඛිත පිළිගැනීමක් ගත හැකිය.

*පුනරාවර්තන නියැලීම් (යොමුව : 26 ඡේදය)*

අ44. පුනරාවර්තන කාර්යයභාරයක් සඳහා නව කාර්යයභාර ලිපියක් හෝ වෙනත් ලිඛිත කාර්යයභාරයක් නොයැවීමට වෘත්තිකයා තීරණය කළ හැකිය. කෙසේ වෙතත්, පහත සඳහන් සාධක මගින් කාර්යයභාර නියමයන් සංශෝධනය කිරීම හෝ කාර්යයභාර පාර්ශවයට දැනට පවතින කාර්යයභාර නියමයන් මතක් කිරීම සුදුසු බව පෙන්විය හැකියඃ

- එකඟ වූ ක්‍රියාපටිපාටිවල අරමුණ හෝ එකඟ වූ ක්‍රියාපටිපාටිවල ස්වභාවය, වේලාව හෝ ප්‍රමාණය පිළිබඳව කාර්යයභාරයේ නිරත පාර්ශවය වරදවා වටහාගෙන ඇති බවට කිසියම් ඇඟවීමක්.
- කලින් එකඟ වූ ක්‍රියාපටිපාටිවල යම් වෙනස්කම් ඇතුළුව කාර්යයභාරයේ ඕනෑම සංශෝධිත හෝ විශේෂ කොන්දේසි.
- කාර්යයභාරයට බලපාන නීතිමය, නියාමන හෝ ගිවිසුම් ගත අවශ්‍යතාවල වෙනසක්.
- කාර්යයභාරයට අදාල පාර්ශවයේ කළමනාකාරිත්වයේ හෝ පාලනය හා සම්බන්ධ පාර්ශවයේ වෙනසක්.

**එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කිරීම** (යොමුවඃ 28 ඡේදය)

අ45. සමහර තත්ත්වයන්හිදී ලිඛිත නියෝජනයක් ඉල්ලා සිටීමට වෘත්තිකයා තීරණය කළ හැකිය, උදාහරණයක් ලෙසඃ

- එකඟ වූ ක්‍රියපටිපාටිවලට විමසීම් ඇතුලත් නම්, වාචිකව සපයා ඇති ප්‍රතිචාර පිළිබඳව ලිඛිත නියෝජනයක් වෘත්තිකයාට ඉල්ලා සිටිය හැක.
- කාර්යයභාරයට අදාලවන පාර්ශවය වගකිව යුතු පාර්ශවය නොවේ නම්, එකඟ වූ ක්‍රියාපටිපාටියක් ලෙස, වගකිව යුතු පාර්ශවයෙන් ලිඛිත නියෝජන සඳහා ඉල්ලීම් ඇතුලත් කිරීමට වෘත්තිකයාට එකඟ විය හැකිය.

**වෘත්තිකයාගේ විශේෂඥයෙකුගේ කාර්යය භාවිතා කිරීම** (යොමුව : 29 ඡේදය)

අ46. වෘත්තිකයෙකුගේ විශේෂඥයෙකුගේ කාර්යය භාවිතා කිරීම, වෘත්තිකයාට සහාය වීමට විශේෂඥයකු භාවිතා කිරීමෙහි ඇතුලත් විය හැකියඃ

- ඉටු කළයුතු ක්‍රියාපටිපාටි පිළිබඳව කාර්යයභාරයට අදාල පාර්ශවය සමඟ සාකච්ඡා කිරීම. උදාහරණයක් ලෙස, ගිවිසුමක නීතිමය කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් සැලසුම් කිරීම සම්බන්ධයෙන් නීතිඥයකු විසින් වෘත්තිකයාට යෝජනා ලබාදිය හැකිය; හෝ
- එකඟ වූ ක්‍රියාපටිපාටි(ය) එකක් හෝ කිහිපයක් ඉටු කිරීම. උදාහරණයක් ලෙස, ධාන්‍ය නියැදියක විෂ මට්ටම තීරණය කිරීම වැනි එකඟ වූ ක්‍රියාපටිපාටිවලින් එකක් රසායන විද්‍යාඥයකු විසින් සිදුකල හැකිය.

අ47. වෘත්තිකයෙකුගේ විශේෂඥයෙකු යනු වෘත්තිකයා විසින් නිරත කරගෙන සිටින බාහිර විශේෂඥයකු විය හැකිය, හෝ ආයතනයේ කොටසක් වන සහ එම නිසා ආයතනයේ තත්ත්ව පාලන පද්ධතියට යටත් වන අභ්‍යන්තර විශේෂඥයකු වේ. ආයතනය හෝ වෙනත් පාර්ශවයන් විසින් සපයනු ලබන තොරතුරු වෙනත් ආකාරයකින් යෝජනා කරන්නේ නම් මිස, ආයතනයේ තත්ත්ව පාලන පද්ධතිය මත විශ්වාසය තැබීමට වෘත්තිකයාට අයිතියක් තිබේ. එම රඳා පැවැත්මේ ප්‍රමාණය තත්ත්වයන් අනුව වෙනස්වන අතර, පහත කාරණා සම්බන්ධයෙන් වෘත්තිකයාගේ ක්‍රියාපටිපාටි වල ස්වභාවය, වේලාව සහ ප්‍රමාණය කෙරෙහි බල පෑ හැකිය;

- බඳවා ගැනීම් සහ පුහුණු වැඩ සටහන් හරහා නිපුනතාවය සහ හැකියාවන්.
- වෘත්තිකයාගේ විශේෂඥයාගේ අරමුණුගත වීම පිළිබඳ වෘත්තිකයාගේ ඇගයීම.
- වෘත්තිකයාගේ විශේෂඥයා සමඟ එකඟතාවය.

එවැනි විශ්වාසයක් මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි අවශ්‍යතා සපුරාලීම සඳහා වෘත්තිකයාගේ වගකීම අඩු නොකරයි.

අ48. වෘත්තිකයාගේ විශේෂඥයා එකඟ වූ ක්‍රියාපටිපාටි(ය) එකක් හෝ කිහිපයක් සිදු කරන්නේ නම් 29(ආ) ඡේදයෙන් අවශ්‍ය වන පරිදි වෘත්තිකයාගේ එම විශේෂඥයා විසින් සිදු කළ යුතු කාර්යයේ ස්වභාවය, විෂය පථය සහ අරමුණු පිළිබඳ එකඟතාවයට විශේෂඥයාගේ ක්‍රියාපටිපාටියේ ස්වභාවය, වේලාව සහ ප්‍රමාණය ඇතුලත් වේ. මීට අමතරව 29(ආ) ඡේදයෙන් අවශ්‍ය කරුණුවලට අමතරව, වෘත්තිකයාගේ විශේෂඥයා සමඟ වෘත්තිකයාගේ එකඟතාවයට පහත කරුණු ඇතුලත් කිරීම සුදුසු විය හැකිය:

(අ) වෘත්තිකයාගේ සහ එම විශේෂඥයාගේ අදාල භූමිකාවන් සහ වගකීම්;

(ආ) එම විශේෂඥයා විසින් සැපයිය යුතු ඕනෑම වාර්තාවක ආකෘතිය ඇතුළුව වෘත්තිකයා සහ එම විශේෂඥයා අතර සන්නිවේදනයේ ස්වභාවය, වේලාව හා ප්‍රමාණය; සහ

(ඇ) වෘත්තිකයාගේ විශේෂඥයාගේ රහස්‍ය අවශ්‍යතා නිරීක්ෂණය කිරීමේ අවශ්‍යතාවය.

අ49 අ47 ඡේදයේ සඳහන්ව ඇති කරුණු වෘත්තිකයා සහ වෘත්තිකයාගේ විශේෂඥයා අතර ගිවිසුම ලිඛිතව තිබීම සුදුසු ද යන්න ඇතුළුව ගිවිසුමේ විස්තර මට්ටමට සහ විධිමත් භාවයට බලපෑ හැකිය. වෘත්තිකයා සහ වෘත්තිකයාගේ බාහිර විශේෂඥයා අතර ගිවිසුම බොහෝ විට කාර්යයභාරයේ ලිපියක ස්වරූපයෙන් පවතී.

අ50 වෘත්තිකයෙකුගේ විශේෂඥයකුගේ කාර්යය භාවිතා කළයුතු විට, 29 වන ඡේදය මඟින් අවශ්‍ය වන ක්‍රියාපටිපාටි සමහරක් කාර්යයභාරයේ පිළිගැනීමේ හෝ අඛන්ඩ අදියරේදී සිදු කිරීම සුදුසු විය හැකිය.

**එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව** (යොමුව: 30 - 33 ඡේද)

අ51. 2 වැනි පරිශිෂ්ඨයෙහි එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවල නිදර්ශන අඩංගු වේ.

*එකඟ වූ ක්‍රියාපටිපාටි සිදු කරනු ලබන විෂයය කරුණු (යොමුව: 30 (ඇ) ඡේදය)*

අ52. අදාල නම්, වරදවා වටහා ගැනීම වළක්වා ගැනීම සඳහා, එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව, එකඟ වූ ක්‍රියාපටිපාටි සිදු කරනු ලබන විෂය කරුණුවලින් ඔබ්බට වූ තොරතුරු දක්වා විහිදෙන්නේ නැති බව වෘත්තිකයා පැහැදිලි කිරීමට කැමති විය හැකිය. උදාහරණයක් ලෙස, අස්තිත්ත්වයක ලැබිය යුතු ගිණුම් සහ තොග සම්බන්ධයෙන් එකඟ වූ ක්‍රියාපටිපාටි සිදු කිරීමට වෘත්තිකයා නියැලී සිටියේ නම්, එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව මෙම ගිණුම්වලට පමණක් අදාල වන අතර, සමස්තයක් වශයෙන් අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශවලට අදාල නොවන බවට ප්‍රකාශයක් ඇතුලත් කිරීමට වෘත්තිකයාට අවශ්‍ය විය හැකිය.

*එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ අරමුණ (යොමුව : 3(ඈ) ඡේදය)*

අ53. 30(ඈ) ඡේදයෙන් අවශ්‍ය ප්‍රකාශයට අමතරව, එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව තනිකරම කාර්යයභාරයේ නියුතු පාර්ශවය හා අපේක්ෂිත පරිශිලකයින් සඳහා පමණක් අදහස් කරන බව දැක්වීම සුදුසු යැයි වෘත්තිකයා සළකා බැලිය හැකිය. නිශ්චිත අධිකරණ බල ප්‍රදේශයේ නීතිය හෝ නියාමනය මත පදනම්ව, එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව බෙදා හැරීම හෝ භාජනය සීමා කිරීමෙන් මෙය සාක්ෂාත් කරගත හැකිය. සමහර අධිකරණ බල ප්‍රදේශවල එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ භාවිතය සීමා කල හැකි නමුත් බෙදා හැරීම සීමා කල නොහැක. වෙනත් අධිකරණ බල ප්‍රදේශවල, එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව බෙදාහැරීම සීමා කල හැකි නමුත් භාවිතය සීමා කල නොහැක.

අ54. එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව (එසේ කිරීමට අවසර තිබේ නම්) බෙදා හැරීම හෝ භාවිතය සීමා කල යුතුද යන්න තීරණය කිරීමේදී වෘත්තිකයා සළකා බැලිය හැකි සාධක, උදාහරණයක් ලෙස:

- අපේක්ෂිත පරිශිලකයින් හැර වෙනත් පරිශීලකයින් එකඟ වූ ක්‍රියාපටිපාටිවල අරමුණ වරදවා වටහා ගැනීම හෝ සොයා ගැනීම් වැරදි ලෙස අර්ථ කථනය කිරීමේ ඉහළ අවදානමක් ඇත.
- එකඟ වූ ක්‍රියාපටිපාටි සැලසුම් කර ඇත්තේ කළමනාකාරිත්වය සහ කාර්යයභාරයේ නියුතු පාර්ශවයේ පාලනය හා සම්බන්ධව නිරත වන අය වැනි අභ්‍යන්තර පරිශීලකයින්ගේ භාවිතය සඳහා පමණි.
- එකඟ වූ ක්‍රියාපටිපාටි හෝ සොයා ගැනීම්වලට රහස්‍ය තොරතුරු ඇතුලත් වේ.

*එකඟ වූ ක්‍රියාපටිපාටි සහ සොයා ගැනීම් (යොමුව: 30(ඛ)-30(ග) ඡේද)*

අ55. රහස්‍ය හෝ සංවේදී තොරතුරු ඇතුලත් නොකර එකඟ වූ ක්‍රියාපටිපාටි හෝ සොයා ගැනීම් විස්තර කිරීමට වෘත්තිකයාට නොහැකි නම්, වෘත්තිකයාට:

- අභ්‍යන්තරව උපදේශනය (උදාහරණයක් ලෙස, සමාගම හෝ ජාල සමාගම තුල);
- බාහිරව උපදේශනය (උදාහරණයක් ලෙස, අදාල වෘත්තීය ආයතනය හෝ වෙනත් වෘත්තිකයෙකු සමඟ); හෝ
- නීති උපදෙස් ලබා ගැනීම.

මගින් කිසියම් නිශ්චිත ක්‍රියා මාර්ගයක් ගැනීමේ වෘත්තීය හෝ නීතිමය ඇඟවුම් අවබෝධ කර ගැනීමට හැකිවේ.

අ56. එකඟ වූ ක්‍රියාපටිපාටි සහ සොයා ගැනීම් පිළිබඳව අපේක්ෂිත පරිශීලකයින්ගේ සළකා බැලීම් සඳහා වැදගත් වන කලින් එකඟ වූ ක්‍රියාපටිපාටි සිදුකර නොමැති වීම හෝ වෙනස්කර ඇති බව වැනි තත්ත්වයන් තිබිය හැක. උදාහරණයක් වශයෙන්, ක්‍රියාපටිපාටි නීතියෙන් හෝ නියාමනයෙන් දක්වා ඇති විට මෙසේ සිදුවිය හැකිය. එවැනි තත්ත්වයන් තුල, වෘත්තිකයාට එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ, සිදු කල නොහැකි හෝ සංශෝධන කරන ලද කාර්යයභාරයේ මුල් නියමයන්වල එකඟ වූ ක්‍රියාපටිපාටි සහ එය පැන නැඟුනේ මන්දැයි හඳුනාගත හැකිය.

අ57. කාර්යයභාරයේ නියමයන් තුල එකඟ වූ ක්‍රියාපටිපාටි එකඟ වූ දිනය වෘත්තිකයාට සඳහන් කළ හැකිය.

*වෘත්තිකයාගේ විශේෂඥයා වෙත යොමුව(යොමුව: 31 ඡේදය)*

අ58. සමහර තත්ත්වයන් තුල, එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ එකඟ වූ ඕනෑම දෙයක් සිදුකල වෘත්තිකයෙකුගේ විශේෂඥයකුගේ ක්‍රියාපටිපාටි, නීතිය හෝ නියාමනයට යොමු කිරීමක් අවශ්‍ය විය හැකිය. උදාහරණයක් වශයෙන්, රාජ්‍ය අංශයේ විනිවිද භාවය සඳහා එවැනි යොමු කිරීමක් අවශ්‍ය විය හැකිය. වෘත්තිකයා වෙනත් අවස්ථාවන්හිදී එය සුදුසු යැයි සැළකිය හැකිය. උදාහරණයක් ලෙස, එකඟ වූ ක්‍රියාපටිපාටි විස්තර කිරීමේදී වෘත්තිකයාගේ විශේෂඥයා වෙත යොමු කරන විටදී, එසේ වුවද, එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ ඇතුලත් සොයාගැනීම් සඳහා වෘත්තිකයාට සම්පූර්ණ වගකීමක් ඇති අතර, එම වගකීම වෘත්තිකයාගේ විශේෂඥයාගේ භාවිතය මගින් අඩු නොවේ. එබැවින් එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව වෘත්තිකයාගේ විශේෂඥයා වෙත යොමු කරන්නේ නම්, එසේ වෘත්තිකයාගේ විශේෂඥයා වෙත යොමු කිරීම නිසා වෘත්තිකයාගේ වගකීම අඩුවන බව වාර්තාවෙන් ඇඟවෙන්නේ නැත.

**එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් තවත් කාර්යයභාරයක් සමඟ එකට භාර ගැනීම** (යොමුව: 34 ඡේදය)

අ59. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයෙන් පැන නඟින නිර්දේශ සැපයීම වැනි එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් සමඟ එක්ව වෙනත් කාර්යයභාරයක් සිදු කිරීමට වෘත්තිකයෙකුගෙන් ඉල්ලා සිටිය හැක. එවැනි ඉල්ලීම්, එකඟ වූ ක්‍රියාපටිපාටි සිදු කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වෘත්තිකයාට එක ඉල්ලීමක ස්වරූපයක් ගත හැකි අතර, විවිධ කාර්යයභාරවල නියමයන් තනි කාර්යයභාරයක ලිපියකින් දැක්විය හැකිය. වරදවා වටහා ගැනීම වැළැක්වීම සඳහා 34 ඡේදය එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව අනෙකුත් කාර්යයභාරවල වාර්තා පැහැදිලිව වෙන්කර හඳුනා ගැනීම අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස, නිර්දේශ විය හැක්කේ.

- එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවෙන් වෙනම ලියවිල්ලක සැපයීම. ; හෝ
- එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව සහ නිර්දේශ යන දෙකම ලේඛනයක ඇතුලත් කිරීම නමුත් නිර්දේශයන් එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවෙන් පැහැදිලිව වෙනස් වේ. උදාහරණයක් ලෙස, එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව සහ ලේඛනයේ වෙනම කොටස් තුල නිර්දේශ ඇතුලත් කිරීමෙන්.

**ලේඛනගත කිරීම** (යොමුව: 35 ඡේදය)

අ60. ඉටු කරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටිවල ස්වභාවය, වේලාව සහ ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් ලේඛනගත කිරීමෙහි ඇතුලත් විය හැකිය. උදාහරණයක් ලෙසඃ

- එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කිරීමේදී විෂය කරුණ(ණු) හඳුනා ගැනීමේ ලක්ෂණ. එකඟ වූ ක්‍රියාපටිපාටියේ ස්වභාවය සහ එකඟ වූ ක්‍රියාපටිපාටිය සිදු කිරීමේදී විෂය කරුණ(ණු) අනුව හඳුනා ගැනීමේ ලක්ෂණ වෙනස් වේ. උදාහරණයක් ලෙසඃ

- o මිළදී ගැනීමේ ඇණවුම් පිළිබඳ ක්‍රියාපටිපාටියක් සඳහා වෘත්තිකයාට එම දිනයන් සහ නියත මිළදී ගැනීමේ ඇණවුම් අංක අනුව තෝරාගත් ලේඛන හඳුනාගත හැකිය.
- o දී ඇති සංගහනයකින් නිශ්චිත ප්‍රමාණයකට වඩා සියළුම අයිතම තෝරා ගැනීමට අවශ්‍ය ක්‍රියාපටිපාටියක් සඳහා වෘත්තිකයාට ක්‍රියාපටිපාටියේ විෂයපථය සටහන් කර සංගහනය හඳුනාගත හැකිය. (උදාහරණයක් ලෙස, නිශ්චිත කාලසීමාවක් සඳහා ජර්නල් ලේඛනයෙන් නියමිත ප්‍රමාණයකට වැඩි සියළුම සටහන්, නිශ්චිත මාස සඳහා නියමිත සංඛ්‍යාවට වඩා වාර්තා කර ඇති පැය සඳහා සියළුම කාල පත්‍රිකා හෝ නිශ්චිත ලැයිස්තුවක සෑම දහවන අයිතමයක්ම).
- o නිශ්චිත පුද්ගලයින්ගේ විමසීම් අවශ්‍ය වන ක්‍රියාපටිපාටියක් සඳහා වෘත්තිකයා විසින් විමසීම්වල දිනයන්, පුද්ගලයින්ගේ නම් සහ රැකියා තනතුරු සහ සිදු කරන ලද විශේෂිත විමසීම් සටහන් කළ හැකිය.
- o නිරීක්ෂණ ක්‍රියාපටිපාටියක් සඳහා, වෘත්තිකයා විසින් නිරීක්ෂණය කරන ලද ක්‍රියාවලිය හෝ කාරණය, අදාල පුද්ගලයින්, ඔවුන්ගේ අදාල වගකීම් හා නිරීක්ෂණය සිදු කරන ලද ස්ථානය සහ කවදාද යන්න වාර්තා කළ හැකිය.

- එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටුකලේ කවුරුන්ද සහ එවැනි ක්‍රියාපටිපාටි ඉටුකල දිනය.
- ඉටුකරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටි සමාලෝචනය කළේ කවුරුන්ද සහ එම සමාලෝචනයේ දිනය හා ප්‍රමාණය.

**1 පරිශිෂ්ඨය**

(යොමුවː අ40 ඡේදය)

**එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් සඳහා නිදර්ශනාත්මක කාර්යයභාරයක නිරතවීමේ ලිපිය.**

පහත දැක්වෙන්නේ මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි අඩංගු අදාල අවශ්‍යතා සහ මඟ පෙන්වීම් විදහා දක්වන එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් සඳහා වූ කාර්යයභාර ලිපියක උදාහරණයකි. මෙම ලිපිය බලගැන්වීමක් නොවන අතර, මෙම SLSRS හි දක්වා ඇති සළකා බැලීම් සමඟ ඒකා බද්ධව භාවිතා කළහැකි මාර්ගෝපදේශයක් පමණක් වීම අදහස් කෙරේ. එය තනි එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන්හි අවශ්‍යතා සහ තත්ත්වයන් අනුව අනුවර්තනය වීමට අවශ්‍ය වනු ඇත. එය තනි වාර්තාකරණ කාල සීමාවක් සඳහා එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් වෙත යොමු කිරීමට කෙටුම්පත් කර ඇති අතර, මෙම ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි විස්තර කර ඇති පරිදි පුනරාවර්තන කාර්යයභාරය අදහස් කරන්නේ නම් හෝ අපේක්ෂා කරන්නේ නම් අනුවර්තනය වීම අවශ්‍ය වේ. ඕනෑම යෝජිත ලිපියක් සුදුසු බවට නීති උපදෙස් ලබා ගැනීම යෝග්‍ය විය හැකිය.

වෙත (කාර්යයභාරයට සම්බන්ධ පාර්ශවය)

[xyz] නිෂ්පාදිතවල ප්‍රසම්පාදනය පිළිබඳ එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක් ඉටු කරන ලෙස ඔබ ඉල්ලා ඇත. මෙම ලිපිය අපගේ කාර්යයභාර නියමයන් හා අරමුණු සහ අප විසින් සපයනු ලබන සේවාවන්හි ස්වභාවය සහ සීමාවන් පිළිබඳ අපගේ අවබෝධය තහවුරු කිරීම සඳහා වේ. අපගේ කාර්යයභාරය සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය 4400 (සංශෝධිත) *එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන්,* අනුව සිදුකෙරේ. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් ඉටු කිරීමේදී, අප ස්වාධීන වීමට අවශ්‍ය නොවන (අදාල ආචාර ධර්ම අවශ්‍යතා විස්තර කරන්න) සමඟ අපි අනුකූල වන්නෙමු.

සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය 4400 (සංශෝධිත) යටතේ සිදු කරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයන් අප ඔබ සමඟ එකඟ වූ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම සහ සොයා ගැනීම් ක්‍රියාපටිපාටි වාර්තාවේ සන්නිවේදනය කිරීම ඇතුලත් වේ. සොයා ගැනීම් යනු සිදු කරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටිවල සත්‍ය ප්‍රතිඵල වේ. ඔබ (සහ අදාල නම් වෙනත් පාර්ශවයන්) කාර්යයභාරයේ අරමුණ සඳහා ක්‍රියාපටිපාටි සුදුසු බව පිළිගනී. ක්‍රියාපටිපාටිවල යෝග්‍යතාවය සම්බන්ධයෙන් අපි කිසිදු නියෝජනයක් නොකරමු. එකඟ වූ ක්‍රියාපටිපාටි සිදු කරනු ලබන විෂය කරුණු සම්බන්ධයෙන් (වගකිව යුතු පාර්ශවය) වගකිව යුතුය යන පදනම මත මෙම එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරය සිදු කෙරේ. තවද, මෙම එකඟ වූ ක්‍රියාපටිපාටි නියැලීම සහතික වීමක් නොවේ. ඒ අනුව අපි මතයක් හෝ සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමු.

අප විසින් සිදු කරනු ලබන ක්‍රියාපටිපාටි ඔබගේ [xyz] නිෂ්පාදිත ප්‍රසම්පාදනය ඔබගේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තිවලට අනුකූලද යන්න තීරණය කිරීමට ඔබට සහයවීම සඳහා පමණි.[6] ඒ අනුව, අපගේ වාර්තාව ඔබවෙත යොමු කරනු ලබන අතර, අපගේ වාර්තාව වෙනත් අරමුණක් සඳහා සුදුසු නොවිය හැක.

පහත ක්‍රියාපටිපාටි ඉටු කිරීමට සහ අපගේ කාර්යයේ ප්‍රතිඵලයක් වන සොයා ගැනීම් ඔබට වාර්තා කිරීමට අප එකඟ වී ඇත:

- [xyz] නිෂ්පාදන, [ලැයිස්තු ගත කිරීම] සඳහා [20X1 ජනවාරි 1 සහ 20X1 දෙසැම්බර් 31] අතර අත්සන් කරන ලද සියළුම ගිවිසුම් ලැයිස්තුවක් [වගකීමේ පාර්ශවයේ] කළමනාකාරිත්වයෙන් ලබාගෙන රුපියල් 25,000 කට වැඩි වටිනාකමක් ඇති සියළුම ගිවිසුම් හඳුනා ගැනීම.
- ලැයිස්තුගත කිරීමේදී හඳුනාගත් සෑම රුපියල් 25,000 ක ගිවිසුමක් සඳහාම, ගිවිසුම ලංසු තැබීමේ වාර්තා සමඟ සංසන්දනය කර සෑම ගිවිසුමක් [වගකිව යුතු පාර්ශවය] "පූර්ව සුදුසුකම් ලත් ගිවිසුම් කරුවන්ගේ ලැයිස්තුවෙන්" අවම වශයෙන් ගිවිසුම් කරුවන් 3 දෙනෙකු විසින් ලංසු තැබීමට යටත් වුවාද යන්න තීරණය කිරීම.
- ලැයිස්තු ගතකර ඇති රුපියල් 25,000 කට වැඩි වටිනාකමක් ඇති සෑම හඳුනාගත් ගිවිසුමක් සඳහාම, අත්සන් කරන ලද ගිවිසුමෙන් ගෙවිය යුතු මුදල අවසානයේ [වගකිව යුතු පාර්ශවය] ගිවිසුම්කරුට ගෙවූ මුදල හා සසඳා අවසානයේ ගෙවූ මුදල, ගිවිසුමේ එකඟ වූ මුදලට සමාන ද යන්න තීරණය කිරීම.

ක්‍රියාපටිපාටි (දිනය) සහ (දිනය) අතර සිදුකළ යුතුය.

අපගේ එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව

අපගේ කාර්යයභාරයේ කොටසක් ලෙස, අපි අපගේ වාර්තාව නිකුත් කරන්නෙමු. එය එකඟ වූ ක්‍රියාපටිපාටි සහ සිදු කරන ලද ක්‍රියාපටිපාටි වල සොයා ගැනීම් විස්තර කරනු ඇත. [එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ අපේක්ෂිත පෝරමය සහ අන්තර්ගතයට සුදුසු සඳහනක් ඇතුලත් කරන්න]

අපගේ කාර්යයභාරයේ, අප එකඟ වී ඇති දේවල් ඉටු කරනු ලබන අතර, ඒවා කාර්යයභාරයේ අරමුණ සඳහා යෝග්‍ය විශේෂිත ක්‍රියාපටිපාටි ඇතුළුව, සඳහා වූ විධිවිධාන පිළිබඳ ඔබගේ පිළිගැනීම සහ එකඟතාවය දැක්වීමට කරුණාකර මෙම ලිපියේ අමුණා ඇති පිටපත අත්සන් කර ආපසු එවන්න.

[උචිත පරිදි ගාස්තු සැකසීම්, බිල්පත් සහ වෙනත් නිශ්චිත නියමයන් වැනි වෙනත් තොරතුරු ඇතුලත් කරන්න]

[සමාගමේ නම]

[එකඟවන පාර්ශවයේ නම] වෙනුවෙන් පිළිගෙන එකඟ වූයේ :

[අත්සන]

[නම සහ තනතුර]

[දිනය]

6 මෙම අවස්ථාවේදී කාර්යභාරයේ නිරත කරන පාර්ශවය ද අපේක්ෂිත පරිශීලකයා වේ.

**2 පරිශිෂ්ඨය**

(යොමුව: 51 ඡේදය)

## එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවල නිදර්ශන

**නිදර්ශන 1**

මෙම නිදර්ශන, එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ අරමුණු සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:

- නිරතකරන පාර්ශවය, ආමන්ත්‍රණය කරන්නා සහ එකම අපේක්ෂිත පරිශීලකයා වේ. නිරතකරන පාර්ශවය වගකිව යුතු පාර්ශවය නොවේ. උදාහරණයක් ලෙස, නියාමකයා නිරතකරන පාර්ශවය හා අපේක්ෂිත පරිශීලක වන අතර, නියාමකයා විසින් අධීක්ෂණය කරනු ලබන අස්තිත්ත්වය වගකිව යුතු පාර්ශවය වේ.
- කිසිදු ව්‍යාතිරේඛයක් හමු නොවේ.
- වෘත්තිකයා එකඟ වූ ක්‍රියාපටිපාටි කිසිවක් සිදු කිරීමට වෘත්තිකයෙකුගේ විශේෂඥයෙකු සම්බන්ධ කර ගන්නේ නැත.
- වාර්තාව භාවිතයට හෝ බෙදා හැරීමට කිසිදු සීමාවක් නොමැත.
- වෘත්තිකයාට අනුකූල වීමට අවශ්‍ය ස්වාධීන අවශ්‍යතා නොමැත.
- ක්‍රියාපටිපාටිය 3 හි ව්‍යාතිරේක වාර්තා කිරීම සඳහා රු: 100 ක ප්‍රමාණවත් සීමාවක් සහභාගි වන පාර්ශවය සමඟ එකඟ වී ඇත.

[xyz] නිෂ්පාදන ප්‍රසම්පාදනය පිළිබඳ එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව
වෙත [ලිපිනකරු]

### මෙම එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ අරමුණ

අපගේ වාර්තාව හුදෙක්ම [කාර්යයභාරයේ පාර්ශවය], එහි [xyz] නිෂ්පාදන ප්‍රසම්පාදනය, එහි ප්‍රසම්පාදන ප්‍රතිපත්තිවලට අනුකූල ද යන්න තීරණය කිරීමේ දී සහාය වීම සඳහා පමණක් වන අතර, වෙනත් අරමුණක් සඳහා සුදුසු නොවිය හැක.

### සම්බන්ධිත පාර්ශවයේ සහ වගකිව යුතු පාර්ශවයේ වගකීම්

[කාර්යයභාරයේ පාර්ශවය] කාර්යයභාරයේ අරමුණ සඳහා එකඟ වූ ක්‍රියාපටිපාටි යෝග්‍ය බව පිළිගෙන ඇත.

[කාර්යයභාරයේ පක්ෂය], විසින් හඳුනාගෙන ඇති පරිදි එකඟ වූ ක්‍රියාපටිපාටි සිදුකරනු ලබන විෂය කරුණු සඳහා [වගකීමේ පක්ෂය] වගකිව යුතුය.

### වෘත්තිකයාගේ වගකීම

සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය 4400 (සංශෝධිත) *එකඟ වූ ක්‍රියාපටිපාටි* කාර්යයභාරයන් අනුව අපි එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරය ඉටු කර ඇත්තෙමු. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක [නියලීමේ පාර්ශවය] සමඟ එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කිරීම සහ ඉටු කරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටි වල සත්‍ය ප්‍රතිඵල වන සොයා ගැනීම් වාර්තා කිරීම ඇතුලත් වේ. එකඟ වූ ක්‍රියාපටිපාටි වල යෝග්‍යතාවය සම්බන්ධයෙන් අපි කිසිදු නියෝජනයක් සිදු නොකරමු.

මෙම එකඟ වූ ක්‍රියාපටිපාටි නියැලීම සහතික වීමක් නොවේ. ඒ අනුව අපි මතයක් හෝ සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමු.

අප අතිරේක ක්‍රියාපටිපාටි සිදු කළේ නම්, වාර්තා වීමට ඉඩ තිබූ වෙනත් කරුණු අපගේ අවධානයට ලක්වීමට ඉඩ තිබුනි.

*වෘත්තිය ආචාර ධර්ම සහ තත්ත්ව පාලනය.*

අප [අදාල ආචාර ධර්මඅවශ්‍යතා විස්තර කරන්න] තුල ඇති ආචාරධර්ම අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇත. මෙම කාර්යයභාරයේ අරමුණ සඳහා , අපට අනුකූල වීමට අවශ්‍ය ස්වාධීන අවශ්‍යතා නොමැත.

අපගේ සමාගම ආචාර ධර්ම අවශ්‍යතා, වෘත්තීය ප්‍රමිතීන් සහ අදාල නීතිමය හා නියාමන අවශ්‍යතා සමග අනුකූල වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තත්ත්ව පාලනය පිළිබඳ ප්‍රමිතිය (SLSQC1), *මූල්‍ය ප්‍රකාශවල විගණන සහ සමාලෝචන සිදු කරන සමාගම් සඳහා තත්ත්ව පාලනය සහ වෙනත් සහතික කිරීම්* හා සම්බන්ධිත සේවා සම්බන්ධවීම් ක්‍රියාත්මක කරන අතර, ඒ අනුව, ලේඛනගත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇතුළුව තත්ත්ව පාලන පිළිබඳ පුළුල් පද්ධතියක් පවත්වාගෙන යයි.

**ක්‍රියාපටිපාටි සහ සොයා ගැනිම්**

අප [xyz] නිෂ්පාදන ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් [සම්බන්ධිත පාර්ශවය] සමග එකඟ වූ පහත විස්තර කර ඇති ක්‍රියාපටිපාටි සිදුකර ඇත.

| | **ක්‍රියාපටිපාටි** | **සොයා ගැනීම්** |
|---|---|---|
| 1 | [xyz] නිෂ්පාදන ["ලැයිස්තු ගත කිරීම"] සඳහා [20X1 ජනවාරි 1] සහ [20X1 දෙසැම්බර් 31] අතර අත්සන් තබන ලද සියළුම ගිවිසුම් ලැයිස්තුවක් [කාර්යයභාරයේ පාර්ශවයේ] කළමනාකාරිත්වයෙන් ලබා ගැනීම සහ රුපියල් 25,000ට කට වඩා වැඩි වටිනාකමක් ඇති සියළුම ගිවිසුම් හඳුනා ගැනීම. | [20X1 ජනවාරි 1] සහ [20X1 දෙසැම්බර් 31] අතර අත්සන් තබන ලද [xyz] නිෂ්පාදන සඳහා සියළුම ගිවිසුම් ලැයිස්තුවක් අපි කළමනාකාරිත්වයෙන් ලබා ගත්තෙමු. ලැයිස්තුගතකර ඇති ගිවිසුම් 125 න් අපි රුපියල් 25,000 කට වඩා වැඩි වටිනාකමකින් යුත් ගිවිසුම් 37ක් හඳුනා ගත්තෙමු. |
| 2 | ලැයිස්තු ගත කර ඇති රුපියල් 25,000 ට වඩා වැඩි වටිනාකමක් ඇති සෑම හඳුනාගත් ගිවිසුමක් සඳහාම, ගිවිසුම ලංසු තැබීමේ වාර්තා සමග සංසන්දනය කර ගිවිසුම [කාර්යයභාරයේ පාර්ශවයේ] "පූර්ව සුදුසුකම් ලත් ගිවිසුම්කරුවන් ගේ ලැයිස්තුවෙන් " අවම වශයෙන් ගිවිසුම්කරුවන් 3 දෙනෙකුට ලංසු තැබීමට යටත් වේද යන්න තිරණය කිරීම. | අපි රුපියල් 25,000 කට වඩා වැඩි වටිනාකමකින් යුත් ගිවිසුම් 37 කට අදාල ලංසු තැබීමේ වාර්තා පරික්ෂා කළෙමු. ගිවිසුම් 37 ම [කාර්යයභාරයේ පාර්ශවයේ] —පූර්ව සුදුසුකම් ලත් ගිවිසුම් කරුවන්ගේ ලැයිස්තුවෙන්" අවම වශයෙන් ගිවිසුම්කරුවන් 3 දෙනෙකු විසින් ලංසු තැබීමට යටත්වන බව අපට පෙනී ගියේය. |
| 3 | ලැයිස්තුගත කර ඇති රුපියල් 25,000 කට වඩා වැඩි වටිනාකමක් ඇති සෑම හඳුනාගත් ගිවිසුමක් සඳහාම, අත්සන් තබන ලද ගිවිසුමේ අවසානයේ ගෙවිය යුතු ප්‍රමාණය [කාර්යයභාරයේ පාර්ශවය] ගිවිසුම් කරුට ගෙවන ප්‍රමාණය හා ගිවිසුමේ ප්‍රමාණය හා සසඳා අවසානයේ ගෙවූ ප්‍රමාණය එකඟ වූ මුදලින් රුපියල් 100 ක් ඇතුලත ද යන්න තීරණය කිරීම. | අපි ලැයිස්තු ගත කර ඇති රුපියල් 25,000 කට වඩා වැඩි වටිනාකමකින් යුත් ගිවිසුම් 37 සඳහා අත්සන් තබන ලද ගිවිසුම් ලබාගත් අතර, ගිවිසුමේ ඇති ගෙවිය යුතු ප්‍රමාණය අවසානයේ [කාර්යයභාරයේ පාර්ශවය] ගිවිසුම්කරුට ගෙවන ලද ප්‍රමාණය හා සංසන්දනය කළෙමු. කිසිදු ව්‍යාතිරේඛයකින් තොරව ගිවිසුම් 37 හිම අවසානයේදී ගෙවන ලද මුදල එකඟ වූ මුදලින් රුපියල් 100 ක් ඇතුලත බව අපට පෙනි ගියේය. |

[වෘත්තිකයාගේ අත්සන]

[වෘත්තිකයාගේ වාර්තාවේ දිනය]

[වෘත්තිකයාගේ ලිපිනය]

**නිදර්ශන 2**

මෙම නිදර්ශිත එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ අරමුණු සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:

- නියැලීමේ පාර්ශවය වගකිව යුතු පාර්ශවයයි. අපේක්ෂිත පරිශීලකයා, නියැලෙන පාර්ශවයට වඩා වෙනස්වූ නියැලෙන පාර්ශවයට අමතරව වූ ලිපිනයකි. උදාහරණයක් වශයෙන්, නියාමකයා අපේක්ෂිත පරිශිලකයා වන අතර, නියාමකයා විසින් අධීක්ෂණය කරනු ලබන අස්තිත්ත්වය නියැලෙන පාර්ශවය හා වගකිව යුතු පාර්ශවය වේ.
- ව්‍යාතිරේඛ සොයා ගෙන ඇත.
- වෘත්තිකයා එකඟ වූ ක්‍රියාපටිපාටියක් සිදු කිරීම සඳහා වෘත්තිකයෙකුගේ විශේෂඥවරයෙකු සම්බන්ධ කරගත් අතර, එම විශේෂඥයා පිළිබඳ සඳහනක් එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ ඇතුලත් වේ.
- වාර්තාව භාවිතය හා බෙදාහැරීම සීමාකර ඇත
- වෘත්තිකයා සම්බන්ධිත පාර්ශවයේ (වගකිව යුතු පාර්ශවය වන) මූල්‍ය ප්‍රකාශ විගණක වේ. මූල්‍ය ප්‍රකාශ විගණනයට අදාල වන ස්වාධීන අවශ්‍යතා සමඟ වෘත්තිකයාගේ අනුකූලතාවය එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා යෝග්‍ය වූ බව වෘත්තිකයා නිරත වන පාර්ශවය සමඟ එකඟ වී ඇත. වෘත්තිකයා කාර්යයභාරයේ නියමයන් තුල, එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා මූල්‍ය ප්‍රකාශ විගණනයට අදාල ස්වාධීන අවශ්‍යතාවලට අනුකූල වීම ඇතුලත් කිරීමට එකඟ වී ඇත.
- වෘත්තිකයා කාර්යයභාරයේ නියමයන් තුල, එකඟ වූ ක්‍රියාපටිපාටි එකඟ වූ දිනය පිළිබඳ සඳහනක් ඇතුලත් කර ඇත.

[XYZ] නිෂ්පාදන ප්‍රසම්පාදනය පිළිබඳ එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාව

වෙත [(ලිපිනකරුවන්]

**මෙම එකඟ වූ ක්‍රියාපටිපාටි වාර්තාවේ භාවිතය සහ බෙදා හැරීම සීමා කිරීම**

අපගේ වාර්තාවේ ඒකායන පරමාර්ථය වන්නේ [xyz] නිෂ්පාදනවල [සම්බන්ධිත පාර්ශවය]ප්‍රසම්පාදනය [අපේක්ෂිත පරිශීලක] ගේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තිවලට අනුකූලද යන්න [අපේක්ෂිත පරිශීලක] හට නිර්ණය කිරීමට සහාය වීම වන අතර වෙනත් අරමුණක් සඳහා මෙය සුදුසු නොවිය හැකිය. මෙම වාර්තාව තනිකරම (නියැලෙන පාර්ශවය) සහ [අපෙක්ෂිත පරිශිලකයින් ] සඳහා වන අතර, වෙනත් පාර්ශවයන් විසින් භාවිතා කිරීම හෝ බෙදා හැරීම නොකළ යුතුය.

**නියැලෙන පාර්ශවයේ වගකීම්**

[කාර්යයභාරයේ පාර්ශවය] එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයේ අරමුණ සඳහා යෝග්‍ය බව පිළිගෙන ඇත.

එකඟ වූ ක්‍රියාපටිපාටි සිදු කරනු ලබන විෂය කරුණු සඳහා [සම්බන්ධිත පාර්ශවය(වගකිව පාර්ශවයද)] වගකිව යුතුය.

**වෘත්තිකයාගේ වගකීම්**

සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය 4400 (සංශෝධිත), *එකඟ වූ ක්‍රියාපටිපාටි* කාර්යයභාරයන්වලට අනුකූලව අප එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරය ඉටු කර ඇත. එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාරයක [සම්බන්ධිත පාර්ශවය] සමඟ එකඟ වූ ක්‍රියාපටිපාටි ඉටු කිරීම සහ ඉටු කරන ලද එකඟ වූ ක්‍රියාපටිපාටි වල සත්‍ය ප්‍රතිඵල වන සොයා ගැනීම් වාර්තා කිරීම ඇතුලත් වේ. එකඟ වූ ක්‍රියාපටිපාටි වල යෝග්‍යතාවය සම්බන්ධයෙන් අපි කිසිදු නියෝජනයක් නොකරමු.

මෙම එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යයභාර සහතික වීමක් නොවේ. ඒ අනුව අපි මතයක් හෝ සහතික නිගමනයක් ප්‍රකාශ නොකරමු.

අප අතිරේක ක්‍රියාපටිපාටි සිදු කලේ නම්, වාර්තා වීමට ඉඩ තිබූ වෙනත් කරුණු අපගේ අවධානයට ලක්වීමට ඉඩ තිබුණි.

*වෘත්තීය ආචාරධර්ම හා තත්ත්ව පාලනය*

අප [අදාල ආචාර ධර්ම අවශ්‍යතා විස්තර කරන්න] අනුව ආචාර ධර්ම අවශ්‍යතාවලට සහ [අදාල ස්වාධීන අවශ්‍යතා විස්තර කරන්න] ස්වාධීන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කර ඇත.[7]

අපගේ සමාගම ආචාර ධර්ම අවශ්‍යතා, වෘත්තීය ප්‍රමිතීන් සහ අදාල නීතිමය හා නියාමන අවශ්‍යතා සමග අනුකූලවීම සම්බන්ධයෙන් *ශ්‍රී ලංකා තත්ත්ව පාලනය පිළිබඳ* ප්‍රමිතිය (SLSQC1), *මූල්‍ය ප්‍රකාශ වල විගණන සහ සමාලෝචන සිදු කරන සමාගම් සඳහා තත්ත්ව පාලනය සහ වෙනත් සහතික කිරීම්* සහ සම්බන්ධිත සේවා කාර්යයභාරයක් සඳහා ව්‍යවහාර කරන අතර, ඒ අනුව, ලේඛනගත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇතුළුව තත්ත්ව පාලන පිළිබඳ පුළුල් පද්ධතියක් පවත්වාගෙන යයි.

**ක්‍රියාපටිපාටි සහ සොයා ගැනීම්**

අප [xyz] නිෂ්පාදන ප්‍රසම්පාදනය පිළිබඳ [කාර්යයභාරයේ පාර්ශවය] සමග එකඟ වූ [දිනය] දිනැති කාර්යයභාරයේ කොන්දේසි අනුව පහත විස්තර කර ඇති ක්‍රියාපටිපාටි සිදුකර ඇත.

| | **ක්‍රියාපටිපාටි** | **සොයාගැනීම්** |
|---|---|---|
| 1 | [xyz] නිෂ්පාදන ["ලැයිස්තුගත කිරීම"] සඳහා [20X1 ජනවාරි 1] සහ [20X1 දෙසැම්බර් 31] අතර අත්සන් තබන ලද සියළුම ගිවිසුම් ලැයිස්තුවක් [සම්බන්ධිත පාර්ශවයේ] කළමනාකාරීත්වයෙන් ලබාගැනීම සහ රුපියල් 25,000 කට වඩා වැඩි වටිනාකමක් ඇති සියළුම ගිවිසුම් හඳුනා ගැනීම. | [20X1 ජනවාරි 1] සහ [20X1 දෙසැම්බර් 31] අතර අත්සන් තබන ලද [xyz] නිෂ්පාදන සඳහා සියළුම ගිවිසුම් ලැයිස්තුවක් අපි කලමනාකාරීත්වයෙන් ලබා ගත්තෙමු.<br>ලැයිස්තුගත කර ඇති ගිවිසුම් 125 න් අපි රුපියල් 25,000 ට වඩා වැඩි වටිනාකමෙන් යුත් ගිවිසුම් 37 ක් හඳුනා ගත්තෙමු. |

7 උදාහරණයක් ලෙසඃ CA ශ්‍රී ලංකා ආචාරධර්ම සංග්‍රහය අදාල ආචාරධර්ම අවශ්‍යතා නම්, මෙම වාක්‍ය ඛණ්ඩය පහත සඳහන් පරිදි දැක්විය හැකිය. "අපි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA ශ්‍රී ලංකා ආචාරධර්ම සංග්‍රහය ) විසින් නිකුත් කරන ලද වෘත්තීය ගණකාධිකාරී වරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහයේ ආචාර ධර්ම අවශ්‍යතා වලට අනුකූලව කටයුතු කර ඇත".

| | ක්‍රියාපටිපාටි | සොයාගැනීම් |
|---|---|---|
| 2 | ලැයිස්තුගත කර ඇති රු. 25000 කට වඩා වැඩි වටිනාකමක් ඇති සෑම හඳුනාගත් ගිවිසුමක් සඳහාම ගිවිසුම ලංසු තැබීමේ වාර්තා සමඟ සංසන්දනය කර ගිවිසුම [වගකිව යුතු කාර්යයභාරයේ පාර්ශවයේ ] " පූර්ව සුදුසුකම් ලත් ගිවිසුම්කරුවන් ගේ ලැයිස්තුවෙන් අවම වශයෙන් ගිවිසුම්කරුවන් 3 දෙනෙකුට ලංසු තැබීමට යටත් වේද යන්න තීරණය කිරීම. [විදේශීය භාෂාවෙන්] ඉදිරිපත් කරන ලද ලංසු තැබීමේ වාර්තා සඳහා සංසන්දනය කිරීමට පෙර වෘත්තිකයා විසින් නියුක්ත කරගත් පරිවර්තකයෙකුගේ සහාය ඇතිව ලංසු තැබීමේ වාර්තා පරිවර්තනය කිරීම. | අපි රුපියල් 25,000 කට වඩා වැඩි වටිනාකමකින් යුත් ගිවිසුම් 37 කට අදාල ලංසු තැබීමේ වාර්තා පරික්ෂා කළෙමු. ගිවිසුම් 37ට අදාල ලංසු තැබීමේ වාර්තා වලින් 5 ක් [විදේශීය භාෂාවෙන්] ඉදිරිපත් කර ඇත. මෙම ලංසු තැබීමේ වාර්තා 5 පරිවර්තනය කිරීමේදී අපට සහාය වීමට අපි පරිවර්තකයෙකු සම්බන්ධ කර ගත්තෙමු.<br><br>ගිවිසුම් 37න් ගිවිසුම් 36 ක්ම [කාර්යයභාරයේ පාර්ශවයේ] " පූර්ව සුදුසුකම් ලත් ගිවිසුම්කරුන්ගේ ලැයිස්තුවෙන්" අවම වශයෙන් 3 දෙනෙකු විසින් ලංසු තැබීමට යටත්වන බව අපට පෙනී ගියේය.<br><br>අපි ලංසු තැබීමට යටත් නොවූ රු 65,000 ක එක් ගිවිසුමක් සොයා ගත්තෙමු. ගිවිසුම් ගත කාල සීමාව අවසානයේ හදිසි අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා මෙම ගිවිසුම ලංසු තැබීමට යටත් නොවූ බව කළමනාකාරිත්වය අප වෙත නියෝජනය කර සිටියේය.<br><br>ලංසු තැබීමේ වාර්තා පරිවර්තනය කිරීමේදී අපට සහාය වීමට පරිවර්තකයාගේ නියැලීම, ක්‍රියාපටිපාටි සිදු කිරීම් සහ සොයාගැනීම් වාර්තා කිරීම සඳහා වන අපගේ වගකීම් අඩු නොකරයි. |
| 3 | ලැයිස්තුගත කර ඇති රු 25,000 ට වඩා වැඩි වටිනාකමක් ඇති සෑම හඳුනාගත් ගිවිසුමක් සඳහාම අත්සන් කරන ලද ගිවිසුමේ අවසානයේ ගෙවිය යුතු ප්‍රමාණය [කාර්යයභාරයේ පාර්ශවය] සැපයුම්කරුට ගෙවන ප්‍රමාණය සහ අවසානයේ ගෙවූ ප්‍රමාණය, ගිවිසුමේ එකඟ වූ ප්‍රමාණයකට සමාන ද යන්න තීරණය කිරීම. | අපි ලැයිස්තු ගතකර ඇති රු 25,000කට වඩා වටිනාකමින් යුත් ගිවිසුම් 37 සඳහා අත්සන් තබන ලද ගිවිසුම් ලබාගත් අතර, ගිවිසුමේ ඇති ගෙවිය යුතු ප්‍රමාණය අවසානයේ [කාර්යයභාරයේ පාර්ශවය] සැපයුම්කරුට ගෙවන ලද ප්‍රමාණය හා සංසන්දනය කළෙමු.<br><br>ගිවිසුම් 37 න් 26 ක් සඳහා [කාර්යයභාරයේ පාර්ශවය] අත්සන් කරන ලද ගිවිසුමේ ගෙවිය යුතු ප්‍රමාණය අවසානයේ ගෙවූ ප්‍රමාණයට වඩා වෙනස් බව අපට පෙනී ගියේය. මෙම සියළු අවස්ථාවලදී කළමනාකාරිත්වය අපට නියෝජනය කර ඇත්තේ ප්‍රමාණයන්හි වෙනස 20X1 සැප්තැම්බර් සිට බලාත්මක වූ [අධිකරණ බල ප්‍රදේශයේ] විකුණුම් බදු අනුපාතයෙහි 1% ක වැඩිවීමක් සඳහා ඉඩ සැලසීමට බවයි. |

[වෘත්තිකයාගේ අත්සන]

[වෘත්තිකයාගේ වාර්තාවේ දිනය]

[වෘත්තිකයාගේ ලිපිනය]

ශ්‍රී ලංකා රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කර ඇත.